

# බුදුගුණ සන්නය.

බු. ව. 2432.

නව අරහාදී

# බුදුගුණ සන්නය.

පුරාතන

තක්කව්‍යාකරණාදියෙහි අතිසමත්

උත්තමයෙකු විසින්

විරචිතයි.

විද්‍යෝදයපරිවෙණාධ්‍යක්ෂකවූවේ

ශ්‍රී සුමඞ්ගලාභිධාන නායකස්ථවිරපාදයන්

වහන්සේගේ ශිෂ්‍යවූ

වැලිවිටියේ ධම්මරතනසාමීන් විසින්

සංශෝධිතයි.

ඒබ්‍රහම් සමරසිංහ මහත්මයා විසින්

අච්චුගස්වනලදී.

1889.

# විඥාපනය.

---

## නමො බුද්ධාය.

"**නවඅරහාදිබුද්ධගුණසන්නය.**" මෙම ඉතා මාහැඟි ප්‍රකරණය කොයි කාලේක කවරෙකුවිසින් කරණලද්දැයි ප්‍රකරණාරම්භාවසානාදි කිසිතැනෙක ප්‍රකාශව නොපෙණේ. නමුත් බෞද්ධධර්‍මයෙහිද තර්කව්‍යාකරණාදි නානාවිධ ශාස්ත්‍රයෙහිද අප්‍රතිහත පටුත්වයක්ඇති සමතෙකුවිසින් කළබැව් මෙහි ප්‍රකාශිත ධර්‍මවිභාග උදාහරණ සූත්‍රශ්ලොකාදියෙන් ඉතා පැහැදිලිව පෙණේ.

සම්‍යක්සම්බුද්ධ ශබ්දයාගේ පදසිද්ධිය දක්වන තැන" ගත්‍යර්ථානාප්‍යාදධාරෙ ච"යන චාන්ද්‍රව්‍යාකරණ සූත්‍රයකින් ක්තප්‍රත්‍යය වීමෙන් වනබවද, පුරිස ශබ්ද සිද්ධිය දක්වන තැන "පූරෙ නතිමා කිලෙසා රමෙසා ච" යන ණ්වාදි සූත්‍රයෙන් කිසප්‍රත්‍යය හා ඌකාරයහට හ්‍රස්වවීමෙනුත් වනබවද, සාරථී ශබ්ද සිද්ධිය දක්වන තැන "සරිස්මා රථි"යන ණ්වාදි සූත්‍රයෙන් රථිප්‍රත්‍යය වීමෙන් සිද්ධවනබවද, ආත්මශබ්ද පදාර්ථ දක්වන තැන "රාශිවත් සාක්ෂීවත් චෛව චක්ෂුවත් මූලවච්චතථා ඝනශෙෂු පචසු ප්‍රාශෛශුරාත්මශබ්දඃ ප්‍රයීයතෙ"යි යන ත්‍රිධාෂඩ්දර්ශනසංග්‍රහ නම්වූ බෞද්ධතර්කයෙහි කියනලද ශ්ලොකයක්ද, "සම්මාසම්බුද්ධො" යන්න විස්තරකරණ තැන" අනුපගතමතිතමගන්‍යපෙතං චරමචරං ක්ෂයමක්ෂයව ක්‍රෘත්‍යනාම්, යතඉහ බුබුධෙ සබොධිමූලෙ බුද්ධමහිතො භගවානතඃ සබුද්ධඃ"යි යන පුෂ්පිතාග්‍රා නම් වෘත්තයෙන් රචනාකරණලද ශ්ලොකයක්ද, ලොකප්‍රතීත අෂ්ටමහාසෘද්ධිය ප්‍රකාශකරණ තැන "අණිමා ලඝිමා ප්‍රාප්තිඃ ප්‍රාකාම්‍යම්මහිමා තථා, ඊශිතා වශිතාචෛව යත්‍රකාමාවශායිතා"යි

තවද බුදුහු අර්හද්මාර්ගඥානය කරණකොටගෙණ ක්ලෙශ ශත්‍රූන් නැසූහෙයිනුත් "අර්හත්" නම් වනසේක්, මෙහි ක්ලෙශයෝම මෙලොව පරලොව සර්වානර්ථ කරවන බැවින් සතුරන් වැනි වෙත්, බුදුහු මෙබඳු රාගාදී ක්ලෙශ නමැති සතුරන් මාර්ගඥාන නමැති ශස්ත්‍රයෙන් සමූලඝාත කළසේක්, එහෙයින් "අරිංණාහතත්වාදර්හත්" යන වාක්‍යයෙහි අරිශබ්දොපපදවූ හිංසාර්ථපඨිත "හන හිංසායාම්" යනධාතුහු කෙරෙන් ලට් ප්‍රත්‍යය ශත්‍රාදෙශයෙනුත් "අර්හත්" නම් වනසේක.

"යස්මා රාගාදිසංඛාතා සබ්බෙපි අරයො හතා,
පඤ්ඤාසත්ථෙන නාථෙන තස්මාපි අරහං මතො"

යනු එහෙයින්ම කියනලදී.

තවද බුදුහු සංසාරචක්‍රයාගේ අර සංඛ්‍යාතවූ දැවි කැපූ හෙයිනුත් "අර්හත්" නම් වනසේක්, මෙහි "සංසාරචක්‍ර" නම් කිමෙක්දයත්?

'ඛන්ධානං පටිපාටි ධාතුආයතනානිච,
අබ්බොච්ඡින්නං වත්තමානා සංසාරොති පවුච්චතීති"

යනුහෙයින් අනවරාග්‍ර සංසාරයෙහි භවයෙන් භවය නොසිඳී පවත්නා රූප වෙදනා සංඥා සංස්කාර විඥාන යන පඤ්චස්කන්ධයන්ගේ පටිපාටියද, චක්ඛුධාතු රූපධාතු චක්ඛුවිඤ්ඤාණධාතු-සොතධාතු සද්දධාතු සොතවිඤ්ඤාණධාතු-ඝාණධාතු ගන්ධධාතු ඝාණවිඤ්ඤාණධාතු-ජිව්හාධාතු රසධාතු ජිව්හාවිඤ්ඤාණධාතු-කායධාතු ඵොට්ඨබ්බධාතු කායවිඤ්ඤාණධාතු-මනොධාතු ධම්මධාතු මනොවිඤ්ඤාණධාතු යන මේ අටළොස්ධාතූන්ගේ පටිපාටියද, චක්ඛායතන සොතායතන ඝාණායතන ජිව්හායතන කායායතන මනායතන රූපායතන සද්දායතන ගන්ධායතන රසායතන ඵොට්ඨබ්බායතන

ධම්මායතන යන මේ ද්වාදසායතනයන්ගේ පළිපාටියද "සංසාර" නම් වේ. හෙම නානාගති පරිභ්‍රමණය කරණවටා ගෙණ යනසෙයින් චක්‍රනාමුදු වේ.

එහි "පඤ්චස්කන්ධ" නම්.

"භූතප්පසාදවිසයා භාවො හදයමිච්චපි,
ජීවිතාහාරරූපෙහි අට්ඨාරස විධං තථා."

යත්හෙයින් ඝනබද්ධලක්ෂණවූ පෘථිවිධාතුය ද්‍රවලක්ෂණවූ ආපොධාතුය උෂ්ණත්වලක්ෂණවූ තෙජොධාතුය චලනලක්ෂණවූ වායොධාතුය යන භූතරූපය, රූපදර්ශනයට කාරණවූ චක්ෂුප්‍රසාදය ශබ්දශ්‍රවණයට කාරණාවූ ශ්‍රොත්‍රප්‍රසාදය ගන්ධාඝ්‍රාණයට කාරණවූ ඝ්‍රාණප්‍රසාදය රසාස්වාදයට කාරණවූ ජිහ්වාප්‍රසාදය ස්පර්ශග්‍රහණයට කාරණවූ කායප්‍රසාදය යන ප්‍රසාදරූපය, චක්ෂුසට ගොචරවූ රූපාලම්බනය ශ්‍රොතසට ගොචරවූ ශබ්දාලම්බනය ඝ්‍රාණයට විෂයවූ ගන්ධාලම්බනය ජිහ්වාවට විෂයවූ රසාලම්බනය කායෙන්ද්‍රියට විෂයවූ ස්පර්ශාලම්බනය විෂයරූපයෝය, ස්ත්‍රීභාවය, පුරුෂභාවය, මනොධාතු මනොවිඥ්ඥාණධාතූන්ට ආධාරවූ හෘදයවස්තුවය, දෙහස්ථිතියට කාරණවූ රූප ජීවිතෙන්ද්‍රියය, ශරීරයපවත්නාවූ ඕජාරූපයෝය යන මේ අටළොස් වැදෑරුම්වූ රූපයෝ "රූපස්කන්ධ" නම් වෙත්.

ඉෂ්ටානුභවනලක්ෂණවූ සුඛවෙදනාවය අනිෂ්ටානුභවන ලක්ෂණවූ දුඃඛවෙදනාවය මධ්‍යස්ථානුභවනලක්ෂණවූ උපෙක්ෂා වෙදනාවය යන වෙදනාත්‍රය "වෙදනාස්කන්ධ" නම් වේ.

රූපාදි අරමුණු ඇඳිනගැන්ම ස්වභාවකොට ඇති සංඥාව "සංඥාස්කන්ධ" නම් වේ.

"සංඛාරෙ චෙතනා ඵස්සා
මනක්කාරායුසණ්ඨිති,
තක්කො චාරො ච වායාමො
පීති ඡන්දාධිමොක්ඛතා.

සද්ධා සති හිරොත්තප්පං
චාගො මෙත්තාමති පුන,
මජ්ඣත්තතා ච පස්සද්ධි
කායචිත්තවසා දුවෙ.

ලහුතා මුදුකම්මඤ්ඤ පාගුඤ්ඤුජ්ජුතා තථා,
දයා මුදුම්වජවාචා කම්මන්තාජීවසංවරෙ.

ලොභො දොසොච මොහොච දිට්ඨිඋද්ධච්චමෙවච,
අහිරිකමනොත්තප්පං විචිකිච්ඡිතමෙව ච.

මානො ඉස්සා ච මච්ඡරං කුක්කුච්චං ථිනමිද්ධකා
ඉති එතානි පඤ්ඤාස සංඛාරක්ඛන්ධසඤ්ඤිතා"යි

යනුහෙයින් චෙතනාවය ස්පර්ශය මනස්කාරය අරූපජීවිතේන්ද්‍රියය එකාග්‍රතාවය විතර්කය විචාරය ව්‍යායාමය ප්‍රීතිය ඡන්දය අධිමොක්ෂය ශ්‍රද්ධාවය ස්මෘතිය හිරිය ඔත්තප්පය අලොභය අද්වේෂය අමොහය මධ්‍යස්ථතාවය කායපස්සද්ධි චිත්තපස්සද්ධි දෙදෙනය කායලහුත්ව චිත්තලහුත්ව දෙදෙනය කායමෘදුත්ව චිත්තමෘදුත්ව දෙදෙනය කායකම්මඤ්ඤතා චිත්තකම්මඤ්ඤතා දෙදෙනය කායප්‍රාගුණ්‍යය චිත්තප්‍රාගුණ්‍යය දෙදෙනය කායර්‍ජුතා චිත්තර්‍ජුතා දෙදෙනය කරුණාවය මුදිතාවය සම්‍යග්වාචාය සම්‍යක්කර්මාන්තය සම්‍යගාජීවය ලොභය ද්වේෂය මොහය මිථ්‍යාදෘෂ්ටිය ඖද්ධත්‍යය අහිරිකය අනපත්‍රපාය සංශය මානය ඊර්ෂ්‍යාවය මාත්සර්‍ය්‍යය පශ්චාත්තාපය ථිනමිද්ධය යන මේ පණස් චෛතසිකධර්මයෝ "සංස්කාරස්කන්ධ" නම් වෙත්.

විෂයවිජානන ලක්ෂණයෙන් එකවිධවූ කුශලා

කුශල අව්‍යාකෘත වශයෙන් ත්‍රිවිධවූ කාමාවචර රූපාවචර අරූපාවචර ලොකොත්තරවශයෙන් චතුර්විධවූ වෙදනා සංඥ සංස්කාරාදී භෙදයෙන් එකුණු නූවක්පමණ ඇති චිත්තය "විඥනස්කන්ධ" නම්වේ.

මේ පඤ්චස්කන්ධයෙහි—

"ඵෙනපිණ්ඩූපමං රූපං වෙදනා බුබ්බුලූපමා
මරීචිකූපමා සඤ්ඤ සංඛාරා කදලූපමා,
මායූපමං ච විඤ්ඤණං දෙසිතාදිච්චබන්ධුනා"යි.

යනුහෙයින් රූපස්කන්ධය පෙණපිඩකට උපමා ඇත්තේය, වෙදනාස්කන්ධය, දියබුබුලකට උපමා ඇත්තේය, සංඥස්කන්ධය මහ අව්වෙහි පෙණෙන මීරිඟුදියට උපමාඇත්තේය, සංස්කාරස්කන්ධය, කෙසෙල්කඳට උපමා ඇත්තේය, විඥනස්කන්ධය, ඉන්ද්‍රජාලයට උපමා ඇත්තේයි.

රූපස්කන්ධය, පෙණපිඩක් වැනිවූයේ කෙසේද යම්සේ පෙණපිඩෙහි කිසි සාරත්වයක් නැත්තේද? එයින් පාත්‍රයක් හෝ තලතැටියක් හෝ චිත්සලිත් ආදී කිසිදෙයක් හෝ කරමහයි ඇරගත නොහැක්කේද, ගතත් එබඳු වැඩක් සිඩනොකොට බිඳියත්තේද, එමෙන් රූපස්කන්ධය නිත්‍යයයි කියාවත් ධ්‍රුවයයි කියාවත් මමය මාගේයයි කියාවත් සිතාගත නොහැක්කේ වේ.

තවද යම්සේ පෙණපිඩ සිදුරු විසිදුරුව නොයෙක්සන්ධි එක්ව බොහෝ දියබරණ ඇටමැඩි කොණ්ඩයින්ආදිවූ නොයෙක්ප්‍රාණීන් ලගිනා තැන් වේද, එපරිද්දෙන් රූපස්කන්ධය, මුඛ නාසිකාදී කුඩාමහත් සිදුරු හා නොයෙක් ඇට නහර ගැලපී, තකොකාටකය, ගණ්ඩුප්පාදය, තාලන්ධිරකය, සූචිමුඛය, පටතන්තුසූත්‍රය, යනාදිවූ අසූකුලයක පණුවන්ට ලගිනාගේත් වේ, දරුවදනාගෙත් වේ, නානා

ගේත් වේ, ගිලානසාලාවත් වේ, ශ්මශානයත් වේ,

තවද යම්සේ පෙණපිඩ ආදියෙන් ඩෙබරගෙඩි යක් පමණ ඇතිව අනුක්‍රමයෙන් ගඟාවර්ත්ත සමුද්‍රා දීයෙහි පර්ව්වතකූටපමණත් මහත්වේද, එපරිද්දෙන් රූපස්කන්ධයද පළමුවෙන් මාතෘකුක්ෂියෙහි ගිමාල යෙහි නුනපුපුළු නම් ප්‍රාණියක්හුගේ උදරරෝමය ක් ප්‍රසන්න තලතෙලක ගලා සත්විටක් ගැසූකල සත්වෙනි වාරයෙහි රෝමාග්‍රයෙහි සිටි තෙල්බිඳු පමණවූ කලලරූපයෙක් ඇතිවේ, ඒ කලලරූප යෙහි ප්‍රතිසන්ධිචිත්තය හටගණී, මෙසේ හටගත් ඒ ප්‍රතිසන්ධිචිත්තයට අනතුරුව භවාඞ්ගසිත් තුදු සෙක් පහළ වේ. ඊට අනතුරු ඒ මනොවාරාවජ්ජ නය පහළ වේ,ඊට අනතුරුව ජනමයෙහි සනෙතා ස උපදවමින් ආත්මග්‍රහණය කෙරෙමින් ලොභ සම්ප්‍රයුක්තසිත් පහළ වේ, මෙසේ ඇතිවූ පහත් තලතෙලිත්තක් වැනි ඒ පූර්වෝක්තවූ කලලරූපය ක්‍රමයෙන් වැඩී සතියක් ගිය කල්හි මස්දෙවි දිය තතක් වැනි අර්බුදාවස්ථාවට පැමිණේ, දෙසතිය ක්ගිය කල්හි මේ අර්බුදාවස්ථාවෙන් පෙරලී බොල් කොට පිසූ ලතුදියතතක් වැනි පෙසිඅවස්ථාවට පැ මිණේ, තුන්සතියක් ගිය කල්හි මේ පෙසිඅවස්ථා ව පෙරලී මුරුතමල් කැකුලක් වැනි ඝනාවස්ථාවට පැමිණේ. සිව්සතියක් ගියකල්හි සේදූ මස්කැටිය ක නැගී පස්පොළක් මෙන් දෙඅත දෙපය ඉස තේරී ප්‍රශාඛාවස්ථාවට පැමිණේ, ඉක්බිති පස්වෙ නි සතියෙහි පටන් එකොළොස්වෙනි සතිය දක් වා මෙදූතුරේ අතුල්පතුල් ඇඟිලි ඇස මුඛ කන් නාසා කිසමග වසමග ආදියද ඉතා සූක්ෂ්මවූ ඇටද ඉසකෙස්ද වෙර ලොම්ද හටගෙණ ක්‍රමයෙන් වැඩී සම්පූර්ණව බඹයක්පමණ වේ, ගව මහිස හස්ත්‍ය ශ්වාදීන්ගේ ශරීරවශයෙන් පර්ව්වතකූට ප්‍රමාණ වේ,

මහමුහුද මස්කැස්බත්ගේ වශයෙන් නොයෙක් සියගණන් යොදුන් පමණත් වේ.

තවද යම්සේ පෙණපිඩ හටගත් කෙනෙහි නැසෙන්නේද මදක්තැන් ගොසිනුත් නැසෙන්නේද මුහුදට ගියකල ඒකාන්තයෙන් ම නැසීයන්නේද එමෙන් රූපස්කන්ධයත් කලලාවස්ථාවෙහිත් නැසෙන්නේය, අර්බුදාවස්ථාවෙහිත් නැසෙන්නේය, පෙශිඅවස්ථාවෙහිත් නැසෙන්නේය,ඝනාවස්ථාවෙහිත් නැසෙන්නේය,ප්‍රශාඛාදී අවස්ථාවලත් නැසෙන්නේය, මවුකුසින් බිහිවූ කලත් නැසෙන්නේය, මන්‍දදශකයෙහිත් නැසෙන්නේය, ක්‍රිඩාදශකයෙහිත් නැසෙන්නේය, වර්‍ණදශකයෙහිත් නැසෙන්නේය, බලදශකයෙහිත් නැසෙන්නේය, ප්‍රඥාදශකයෙහිත් නැසෙන්නේය, ශායනදශකයෙහිත් නැසෙන්නේය,ප්‍රාග්භාරදශකයෙහිත්නැසෙන්නේය, ප්‍රවංකදශකයෙහිත් නැසෙන්නේය, මොමුහදශකයෙහිත් නැසෙන්නේය, ශයනදශකයෙහිත් නැසෙන්නේය, මේ අතර නොනැසී සිටියේනමුත් සත්‍යාප්‍රඥාකායන්ගේ රූපය අවුරුදු සියයක් පිරුණු කල ඒකාන්තයෙන් බිඳේ, මරුමුවට පැමිණ සුණු විසුණුවේ, එහෙයින් බුදුහු "රූපස්කන්ධය" පෙණපිඩකට උපමා ඇත්තේයයි වදාළසේකි.

"වෙදනාස්කන්ධය" දියබුබුලක්බඳු වූයේ කෙසේද? දියබුබුල කිසි සාරත්වයක් නැත්තේද, දුවිලද ඇරගත නොහැක්කේද, එයින් පළඟක් හෝ අසනායක් හෝ අඞ්ගුලිමුද්‍රිකාවක් හෝ කර්ණභූෂණයක් හෝ කොට ගතනොහැක්කේද, සාරය නිත්‍යය ධ්‍රැවයයි සිතාගත නොහැක්කේවේ, ගතත් එලෙස සථිරව නොසිටී.

තවද යම්සේ දියබුබුල දියපිට නැගී ඩුලිමල දී යබිඳු දියරෙන් එකතැන්කොට දූවානකරඬු පිය

නාත් මෙන් වටකොටගන්නා වාෂුයයි යන කාරණ සතරකින් ඇතිවේද, එපරිදෙන් වේදනාවද චක්ෂුප්‍රසාදාදි වස්තුවය රූපාදි ආලම්බණය ලොභාදි කෙලශමලය චක්ෂුස්පර්ශාදි ස්පර්ශඝට්ටනය යන සතරකාරණයක් පහළ වේ, එහෙයින් බුදුහු "වේදනාස්කන්ධය" දියබුබුලක් හා සාදෘශ්‍යයයි වදාළසේක.

"සංඥාස්කන්ධය" මිරිඟුදිය හා සදෘශවූයේ කෙසේද? යම්සේ ග්‍රීෂ්මකාලයෙහි මහ අව්වෙහි පෙණෙනා මිරුඟුදිය චංචලව මහවතුරේ රැළගසන්නා සේ පෙණේද, එමෙන් නිල්පැහැය රත්පැහැය යනාදින් සලකුණුගන්නා සංඥාව අනුභවය පිණිස පොපි ගණී, තවද යම්සේ මිරිඟුදිය පිරුණු පොකුණක්මෙන් පෙණී පිපාසයෙන් පීඩිතවූ මෘගයන් වංචා කෙරේද, එමෙන් සංඥාවද මේ නිල්වන් රූපය මේ රත්වන් රූපය මේ සම්වන් රූපය සුභය මනාපය සැපය නිත්‍යයයි ප්‍රශංසාකරවා සත්වයන් වංචා කෙරේ, එහෙයින් බුදුහු "සංඥාස්කන්ධය" මිරිඟුදිය හා සමානයයි වදාළසේක.

"සංස්කාරස්කන්ධය" අසාර නිස්සාරපීයෙන් කදලිස්කන්ධයක් හා සදෘශවේ, යම්සේ කෙහෙල්කඳින් කිසිවක් ගෙණ ගොනැස් පැලහන් පට්ටිගාආදිවූ කිසිගෘහකර්මාන්තාදියක් කොටගත නොහැකිවේද, ගතත් ස්ථිරව නොසිටීද, එපරිදෙන් සංස්කාරයෝද නිත්‍යය ධ්‍රැවය මමය මාගේයයි ග්‍රහණ කටයුත්තාහු නොවෙත්, තවද යම්සේ කදලිස්කන්ධය බොහෝ පතුරු වැටි සමූහ වේද එපරිද්දෙන් සංස්කාරස්කන්ධය බොහෝ ධර්මරාශියක් වේ, තවද යම්සේ කදලිස්කන්ධයෙහි පිටපතුරු වෙනපැහැයෙක් වේද ඇතුළු පතුරුත් ක්‍රමයෙන් වෙන වෙන පැහැ වෙන වෙන ආර ඇතිවේද, එපරිද්දෙන් චේෂ්ටාස්පර්ශාදී නානාස්වභාව ඇති සමපණස් ධර්මයෝ එක්ව

සංස්කාරස්කන්ධ නම් වේ, එහෙයින් බුදුනු “සංස්කාරස්කන්ධය” කදලිස්කන්ධයක් හා සදෘශයයි වදාළසේකි.

“විඥානස්කන්ධය” අසාරත්වයෙන් ඉන්ද්‍රජාලයක් වැනි වේ, හේ කෙසේද? යම්සේ ඉන්ද්‍රජාලය මදකලක් පැවත ඉතා ශිඝ්‍රව නැතිවේද, ඊටවඩා සතසගුණයෙන් චිත්තයම ස්වල්පකාලයක් පැවත නැසෙන්නේ වේ, එකම චිත්තයෙන් පුරුෂයා ආයේය, ගියේය, සිටියේය, උන්නේයයි වැටහෙන්නේය, නමුත් එනකල්හි වෙනසිතෙක් වේ, යන කල්හි වෙනසිතෙක් වේ, සිටිනාකල්හි වෙනවෙන සිතෙක් වේ, හිඳිනාකල්හි ආදියෙහිද වෙනසිතක් වේ, තවද යම්සේ ඉන්ද්‍රජාලය මහජනයා වඤ්චිතකොට කැටකැබිලිති ආදි කිසිවක් රන් රිදී මිණි මුතුයයි ග්‍රහණය කරවාද, එපරිද්දෙන් මේ විඥානස්කන්ධ නම්වූ චිත්තයත් එකම චිත්තයෙන් ආවාක්මෙන් ගියාක්මෙන් සිටියාක්මෙන් උන්නාක්මෙන් වඤ්චා කෙරේ, එහෙයින් බුදුහු “විඥානස්කන්ධය” ඉන්ද්‍රජාලයට උපමා ඇත්තේයයි වදාළසේකි—තවද,

රාශිවත්සාජීවච්චෙව චක්‍රවද්මුෂ්ටිවත්තථා
ස්කන්ධෙෂු පඤ්චසු ප්‍රාඥෛරනාත්මශබ්දඃ ප්‍රගීයතෙ.

ක්‍රියාෂඩ්දශීනසඞ්ග්‍රහ නම්වූ බෞද්ධතන්ත්‍රයෙහි කීහෙයින්—රාශිවත්, ධාන්‍යරාශිය යවරාශිය මුද්ගරාශියයි කීකල ධාන්‍ය යව මුද්ගයන් හැර අන්‍යරාශියක් නැත්තාක් මෙන්ද; සාජීවත්, ජංඝසාජී ශකටසාජීයයි කීකල ගැල් ගොන් බඩුපොදිවණික්ජනයා හැර අනික් සාජීයයි යන දෙයක් නැත්තාක් මෙන්ද; චක්‍රවත්, අලාතචක්‍රය රථචක්‍රය කුලාලචක්‍රයයි කීකල මණ්ඩලාකාරයෙන් වළල්ලක්මෙන් වට ගිනිපෙණෙහෙල්ල රියඋපකරණ පෝරුකඩ විනා අන් චක්‍රයයි යන දෙයක් නැත්තාක් මෙන්ද; මුෂ්ටිවත්,

මිටයයි කිතල අකුලුවාගත් ඇඟිලිපසට මිටයයි ය න ව්‍යවහාරයමුත් ඇඟිලිහැර මිටයයි යන අන්ව සතුවක් නැත්තාක් මෙන්ද; ඝනකෙන්ධ පඤ්චස්කන්ධ, රූප වෙදනා සංඥ සංස්කාර විඥනය යන පඤ්චස්කන්ධ යෙහි; ආත්මශබ්දඃ ආත්මය යන ව්‍යවහාර ශබ්දමාත්‍ර යෙක්; ප්‍රාඥෙඃ, නුවනැත්තන් විසින්; ප්‍රගීයතෙ, කියනුලැබේ හෙවත් ව්‍යවහාරකරණුලැබේ. එයි න් මෙසේ සවභාව ධර්මරාශිමාත්‍රවූ ආත්ම ආත්මීය ශූ න්‍යවූ ස්කන්ධපඤ්චකයෙහි මමය මාගේය යන විපරී තග්‍රහණය නොකටයුත්තේයි.

මේ සංසාර චක්‍රය ප්‍රතීත්‍යසමුත්පාද ක්‍රමයෙන් මෙසේ දතයුතු.

"අවිජ්ජාපච්චයා සංඛාරා සංඛාරපච්චයා විඤ්ඤා ණං විඤ්ඤාණපච්චයා නාමරූපං නාමරූපප ච්චයා සළායතනං සළායතනපච්චයා ඵස්සො ඵස්සපච්චයා වෙදනා වෙදනාපච්චයා තණ්හා තණ්හාපච්චයා උපාදානං උපාදානපච්චයා භ වො භවපච්චයා ජාති ජාතිපච්චයා ජරාමරණං සොක පරිදෙවදුක්ඛ දො ම න ස්සූ පා යා සා ස ම්භවන්ති එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛ න්ධස්ස සමුදයො හොති"යි

අවින්දියං වින්දතීති අවිජ්ජා-නොවිඳයුතුවූ දුශ්චරි තය විඳිනුයි අවිද්‍යා නම් වේ-වින්දියං නවින්දතීති අවි ජ්ජා-පැමිණියයුතු කායසුචරිතාදියට නොපැමිණේ නුයි අවිද්‍යා නම්වේ-ඛන්ධානං රාසට්ඨං ආයතනානං ආයතනට්ඨං ධාතූනං සුඤ්ඤතට්ඨං ඉන්ද්‍රියානං අධි පතියට්ඨං සච්චානං තථට්ඨං අවිදිතං කරොතීති අවිජ්ජා—රූපාදිපඤ්චස්කන්ධයන්ගේ රාශ්‍යර්ථයද ච ක්ඛායතනාදි ෂඩායතනයන්ගේ චක්ෂුර්විඥනාදීන් පවත්වන සවභාවයද චක්ඛුධාත්වාදි අෂ්ටාදශ ධාතූ න්ගේ ධ්‍රුවශුභසුඛාදීන් ශූන්‍යත්වය දශඉන්ද්‍රියයන්ගේ

ආධිපත්‍යයද දුඃඛාදි චතුස්සත්‍යයන්ගේ තථස්වභාවයද ඇසවසා බැඳිකඩක් මෙන් සම්මෝහභාවයෙන් නොදතදේනුයි අවිද්‍යා නම් වේ.

අවිජ්ජාපච්චයා, මෙබඳු අවිද්‍යාප්‍රත්‍යයෙන් හෙවත් නූනුවනයයි ක්‍රියනලද අවිද්‍යාවකාරණකොට ගෙණ; සංඛාරා, පුඤ්ඤාභිසංඛාරය අපුඤ්ඤාභිසංඛාරය ආනඤ්ජාභිසංඛාරය යන ලෞකික කුශලාකුශල චේතනාවෝ; සම්භවන්ති, වෙත්; සංඛාරපච්චයා, මේ ත්‍රිවිධවූ සංස්කාරප්‍රත්‍යයෙන්; විඤ්ඤාණං, ප්‍රතිසන්ධිවිඥානය හෙවත් ප්‍රතිසන්ධිවශයෙන් එකුන්විසිවැදෑරුම්වූ ප්‍රවෘත්තිවශයෙන් දෙතිස්වැදෑරුම්වූ විපාක විඥානය; සම්භවති, වේ; විඤ්ඤාණ පච්චයා, මේ යථොක්තවිඥාන ප්‍රත්‍යයෙන්; නාමරූපං වෙදනාදි චතුස්ස්කන්ධ සංඛ්‍යාතවූ නාමයද භූතොපාදාය භේදවශයෙන් විප්‍රකාරවූ කර්මජරූපයද යන නාමරූපදෙක; සම්භවන්ති, වෙත්; නාමරූපපච්චයා, නාමරූප ප්‍රත්‍යයෙන්; සළායතනං, චක්ඛායාතනය සොතායතනය ඝාණායතනය ජිව්හායතනය කායායතනය මනායතනය යන ෂඩ්විධවූ ආධ්‍යාත්මිකායතනය; සම්භවති, වේ, සළායතන පච්චයා, ෂඩායතනප්‍රත්‍යයෙන්; ඵස්සො, චක්ඛු සම්ඵස්සො සොතසම්ඵස්සො ඝානසම්ඵස්සො ජිව්හාසම්ඵස්සො කායසම්ඵස්සො මනොසම්ඵස්සො යන ෂඩ්වාරිකවූ ස්පර්ශය, සම්භවති, ලැබේ; ඵස්සපච්චයා, ස්පර්ශප්‍රත්‍යයෙන්; වෙදනා, චක්ඛුසම්ඵස්සජා වෙදනා සොතසම්ඵස්සජා වෙදනා ඝානසම්ඵස්සජා වෙදනා ජිව්හාසම්ඵස්සජා වෙදනා කායසම්ඵස්සජා වෙදනා මනොසම්ඵස්සජා වෙදනා යන ෂඩ්විධවූ වෙදනාව නොහොත් සුඛදුක්ඛොපෙක්ෂාවශයෙන් ත්‍රිවිධවූ වෙදනාව; සම්භවති, වේ; වෙදනාපච්චයා, මේ යථොක්තවූ වෙදනා ප්‍රත්‍යයෙන්; තණ්හා, රූප

තණ්හා සද්දතණ්හා ගන්ධතණ්හා රසතණ්හා ඵො
ට්ඨබ්බතණ්හා ධම්මතණ්හා යන ෂට්විධවූ තෘෂ්ණාව,
නොහොත් කාමතෘෂ්ණාදිවශයෙන් ත්‍රිවිධවූ ආධ්‍යා
ත්මික බාහ්‍ය අතීතානාගත වර්තමානකාල ෂඩාල
ම්බන භෙදයෙන් අෂ්ටොත්තර ශතප්‍රභෙදවූ තෘ
ෂ්ණාව, සම්භවති, වේ; තණ්හාපච්චයා, තෘෂ්ණාප්‍ර
ත්‍යයෙන්; උපාදානං, කාමුපාදානය දිට්ඨුපාදානය
සීලබ්බතුපාදානය අත්තවාදුපාදානය යන චතුර්වි
ධොපාදානය; සම්භවති, වේ;(උපාදානයනම් කාත්
විසින් කියා හරවාගත නොහැකිලෙස දැඩිකොට
කුම්භිලග්‍රාහයක් මෙන් අරමුණු ගෙණ පවත්නාවූ
කාමතෘෂ්ණාදියයි)උපාදානපච්චයා, උපාදාන ප්‍රත්‍ය
යෙන්; භවො, කාමාවචර රූපාවචර අරූපාවචර
වශයෙන් එකුන්තිස් වැදෑරුම්වූ කම්මභවයද කාම
භවය රූපභවය අරූපභවය සඤ්ඤීභවය අසඤ්ඤී
භවය නෙවසඤ්ඤී නාසඤ්ඤීභවය එකවොකාර
භවය චතුවොකාර භවය පඤ්චවොකාර භවය යන
නවවිධවූ උත්පත්තිභවය; සම්භවති, වේ; භවප
ච්චයා,මේ ද්විවිධවූ භවයන් අතුරෙන් කම්මභව ප්‍රත්‍ය
යෙන්; ජාති, ඒ ඒ භවයෙහි ස්කන්ධයන්ගේ පහළවී
මයයි කියනලද සත්වොත්පත්තිය; සම්භවති, වේ;
ජාතිපච්චයා, උක්තප්‍රකාර ජාතිප්‍රත්‍යයෙන්; ජරා-ස්ක
න්ධයන්ගේ මිරිකීමයයි කියනලද ජරාවද; මරණං-
ස්කන්ධයන්ගේ බිඳීමයයි කියලද මරණයද; සො
ක-මට යමෙක් පළමු වීද ඒ මට දැන් නැත්වීයයි අ
භ්‍යන්තර චින්තාවශයෙන් උපදනාවූ ලක්ෂණඇ
ති සොකයද; පරිදෙව-තන්නිශ්‍රිත ආලාපසංඛ්‍යාත
වූ පරිදෙවයද; දුක්ඛ-කායප්පති පීළනලක්ෂණ ඇ
ති දුඃඛයද; දෞමනස්ස-මනොවිඝාතලක්ෂණ ඇති
දෞර්මනස්‍යයද, උපායාසො, විෂාදලක්ෂණඇති උ
පායාසයද; යන මොහු; සම්භවන්ති, වෙත්; එවං,
මේ යථොක්තවූ ප්‍රත්‍යය පරම්පරාවශයෙන්ම; කෙ

වලස්ස, සුඛාදීන් අමිශ්‍රවූ, නොහොත් සියලු එතස්ස දුක්ඛක්ඛන්ධස්ස, මේ ත්‍රෛභූමිකවෘත්ත සංඛ්‍යාතවූ දුඃඛ රාශීහුගේ, සමුදයො හොති, උත්පත්තිය වේ, ඊශ්වර නිර්මාණාදි වශයෙන් උත්පත්තියෙක් නොවේ, ප්‍රතීත්‍යසමුත්පාද යෙහි හි මේ සංසාර චක්‍රයෙහි අවිද්‍යා සංස්කාරවය එක්සංක්ෂෙපයෙකි, විඥානනාමරූප ෂඩායතන ස්පර්ශ වෙදනා පස එක් සංක්ෂෙපයෙකි, තෘෂ්ණා උපාදාන භව තුණ එක්සංක්ෂෙපයෙකි, ජාතිජරාමරණතුණ එක්සංක්ෂෙපයෙකි, මේ සතර සංක්ෂෙපයෝ කාලවිභාගයෙන් අතීත හෙතුය එතරහි විපාකය එතරහි හෙතුය අයති විපාකයයි සතරදෙනෙක්වෙත් මේ සතර සංක්ෂෙපයන් අතුරෙන් අවිද්‍යාසංස්කාරයයි යනපූර්වසංක්ෂෙපය අතීත අද්ධානම් වේ, විඥාන නාමරූප ෂඩායතන ස්පර්ශ වෙදනා සංක්ෂෙපය තෘෂ්ණා උපාදානභවසංක්ෂෙපය යන මධ්‍යයෙහිවූ සංක්ෂෙපවය වර්තමාන අද්ධා නම් වේ-ජාති ජරා මරණය යන පශ්චිමවූ සංක්ෂෙපය අනාගත අද්ධානම් වේ,-අවිද්‍යා සංස්කාර තෘෂ්ණා උපාදාන භව යනමේ ධර්මපඤ්චකයඅතීතකාලයෙහිකර්මප්‍රවෘත්තයි, විඥාණනාමරූප ෂඩායතනස්පර්ශවෙදනා යනමේ ධර්ම පඤ්චකය එතරහි විපාකවෘත්තයි, තෘෂ්ණා උපාදාන භව අවිද්‍යා සංස්කාරය යනමේ ධර්ම පඤ්චකය එතරහි කර්මවෘත්තයි, ජාතිජරාමරණයින් ග්‍රහණයකරණලද විඥාණ නාමරූප ෂඩායතන ස්පර්ශ වෙදනා යනමේ ධර්ම පඤ්චකය අනාගත භවයෙහි විපාකවෘත්තයි මෙසේ වෘත්තවශයෙන් කියනලද ධර්මයෝ.

අතීතෙ හෙතවො පඤ්ච ඉදානි ඵලපඤ්චකං
ඉදානි හෙතවො පඤ්ච ආයතිං ඵලපඤ්චකා

යනාදීන් දක්වනලද අතීතහෙතුපඤ්චකාදි ආකාර වශයෙන් කොට්ඨාස වශයෙන් විසිවැදෑරුම් වෙත්, මේ

විංශති ආකාරයන් අතුරෙන් සංස්කාර විඥාන දෙදෙනාගේ අතර එක් සන්ධියෙකි, වේදනා තෘෂ්ණා දෙදෙනාගේ අතර එක් සන්ධියෙකි, භව ජාති දෙදෙනාගේ අතර එක්සන්ධියෙකි, මෙසේ අධ්වත්‍රයක් ඇති ද්වාදශාඞ්ගයක් ඇති විසත්‍යාකාරයක් ඇති ත්‍රිසන්ධියක් ඇති චතුස්සංක්ෂෙපයක් ඇති වෘත්තත්‍රයක් ඇති මූලද්වයක් ඇති ප්‍රතීත්‍යසමුත්පාදවශයෙන් කියනලද අවිද්‍යාමය නාභි ඇති ජරාමරණ නමැති නිම් වළලු ඇති අවිද්‍යා පූර්වංකොට ඇති සංසාරචක්‍රය භාග්‍යවත්වූ බුදුරජානන්වහන්සේ ශ්‍රීමහාබොධිද්‍රැම මූලයෙහිදී මසැසින්දක්නාක්මෙන් සර්වප්‍රකාරයෙන් නුවණැසින් ප්‍රත්‍යක්ෂකොට දැක ඒ අවිද්‍යාදි ධර්මයන් කෙරෙහි කලකිරී ශ්‍රොතාපත්ත්‍යාදි ලොකොත්තරවූ චතුර්මාර්ගයෙන් ඔවුන්කෙරෙහි නොඇලී උත්කෙරෙත් මිදෙනු කැමති සේක් යථොක්තවූ මේ සංසාර චක්‍රයාගේ අර සංඛ්‍යාතසංස්කාරාදීන් එම බොධිද්‍රැමමූලයෙහිදී සඥානිරූඪහනය සත්‍යනිශ්ශීපණය කෘත්‍ය ඇති වීර්‍ය්‍යනමැති පාදවයෙන් සීලනමැති පෘථ්වියෙහි සම්පාදන වශයෙන් පිහිටා අනවද්‍යධර්මානුනාසාධක ශ්‍රද්ධානමැති හස්තයෙන් කාමාවචරකර්මාදි ප්‍රභෙද ඇති සියලුකර්මයන්ක්ෂයකරන්නාවූ සමාධිසිලාගෙහි මුවහත් තබනලද මාර්ගඥානනමැති පරසුව ගෙණ විගත විධ්වස්තභාවයට පැමිණවූසේකි-කපා සුණුවිසුණු කළසේකි එහෙයින් බුදුහු, ''අරාණං හතත්තාවා අරහන්'' යන වාක්‍යයෙන් අරශබ්දපපදවූ යථොක්ත ''හන හිංසායාම්'' යන ධාතුයෙනුත් අර්හත් නම් වනසේකි.

අරා සංසාරචක්කස්ස හතා ඤාණාසිනා යතො
ලොකනාථෙන තෙනෙස අරහන්ති පවුච්චති.

සත්‍යහෙයින්ම කියනලදී—තවද, බුදුහු චීවරාදි චතුර්විධ ප්‍රත්‍යයටද පූජාවිශෙෂයටද සුදුසුවනසේකි.

එහෙයින්ම බුදුන් ලොව උපන්කල්හි යම්කිසි මහා ඥානානුසම්පන්නවූ දිව්‍ය මනුෂ්‍ය කෙනෙක් ඇද්ද, ඔහු බුදුන් හැර අන්තැනකට පූජාසත්කාර නොකෙරෙත්. එසේමැයි සහම්පති නම් මහාබ්‍රහ්මයාම බුදුන්ට මහමෙරක් රුවන්දමකින් පූජාකළා, සෙසුදෙවියෝද කොසොල් බිම්බිසාරාදි මනුෂ්‍යයෝද තමතමන්ගේ ශක්තිවූ පරිද්දෙන් පූජා කළාහුය්-පිරිනිවි බුදුන් උදෙසා ධර්මාශෝක මහරජ්ජුරුවෝද සයානූ කෙළක් ධන වියදම්කොට සමස්තජම්බුද්වීපයෙහි සුවාසූ සුදහසක් විහාර කරවා පූජා කළාහුයි-මෙසේ බුදුහු දිව්‍යබ්‍රහ්මාදීන් විසින් කරණලබන උදාරතර "ප්‍රත්‍යයාදීනාමගීත්වාදගීත්" යනවාක්‍යයෙහි "අග්ගි මහ පූජයාමි" යන්නහු කෙරෙන් අග්ගි, විශිෂ්ට, කනත්‍යයෙහි නිපාතන ශත්‍රුත්‍යනාම චණයෙන් අගීත් නම් වනසේක.

පූජාවිසෙසං සහ පුබ්බයෙහි
යස්මා අයං අරහති ලොකනාථො
අත්ථානුරූපං අරහන්ති ලොකෙ
තස්මා ජිනො අරහති නාමමෙතං

යනුහෙයින්ම කියනලදී—තවද බුදුහු ලොභමොහාදි පාපහෙතූන් සුප්‍රහීණබැවින් රහසත් පව් නොකරණසේක-යම්සේ ලොකයෙහි අපි පණ්ඩිතයමහ යන මත් ඇති යම් කිසි අඥානකෙනෙක් අකීර්තිභයින් රහස පව් කෙරෙද්ද. එපරිද්දෙන් බුදුහු කිසිකලෙකත් රහසත් පව් නොකරණසේක. එහෙයින්, "පාපකරණෙ රහො 'භාව:දගීත්' යන වාක්‍යයෙහි නෛරුක්තික විධියෙනුත් අගීත් නම් වන සේක.

යස්මා නත්ථිරහො නාම පාපකම්මෙසු තාදිනො
රහාභාවෙන තෙනෙස අරහං ඉති විස්සුතො

යනුහෙයින්ම කියනලදී—මේ අටුවාංයෙහි කී අර්ථ පත්පනතියයි—තවද

ආරකා මහබුඩීනං ආරකා ච විජානතො
රහානං සුපහීණතතා වීදූනාච රහෙයයතො
භවෙසුච රහාභාවා පාසංසා අරහං ජිනො

යනුහෙයින් බුදුහු අභාවිතකායසීලචිතතප්‍රඥ ඇති අඥනීණරාගමවෂමොහයෙන් වෘතපතතාම්ත්‍ර ප්‍රතිප නතනීනාධිමුකතිකවූ අසජ්ජනයන් කෙරෙන් ඉතා දුරුවූහෙයිනුත් අහීත් නම් වනසේක.

සමමා නපටිපජ්ජනති සුපහීණාධිමුතතිනා
ආරකා තෙහි ආසනෙන තෙනාපි අරහං ජිනො

යනුහෙයින්ම කියනලදී—තවද බුදුහු භාවිතකාය ශීලචිතතප්‍රඥඇති ප්‍රහීණරාගමවෂමොහයෙන් යුකත ප්‍රහීණනාධිමුකතිකවූ සාධුජනයන්ට ආසනන හෙයිනුත් අහීත් නම් වනසේක.

සම්මාච පටිපජ්ජනති සුපහීණාධිමුතතිනා
ආරකා තෙහි ආසනෙන තෙනාපි අරහං ජිනො

යනුහෙයින්ම කියනලදී—තවද බුදුහු ආතමනිත පරහිත පරිපූරණය පිණිස සම්‍යක්ප්‍රතිපනන සාධු ජනයන්විසින් ආසනනභාවයෙන් එකානතයෙන් රහිතව්‍ය පරිත්‍යජ්‍ය ප්‍රහාතව්‍යවීයෙන් රහසංඛ්‍යාතවූ රාගාදී පාපධර්මයන් බොධිමූලයෙහිදීම ප්‍රහීණකල බැවින් අහීත් නම් වනසේකි, මේ අර්ථපක්‍ෂයෙහි "න සනති රහා එතසාාති" අරහො යි කියයුතෙතහි : ඔ කාරයහට සානුස්වාර අකාරයක් කිරීමෙන් අරහං යනු සිඩයි.

පාපධම්මා රහා නාම සාධූහි රහිතබ්බතො
සම්මාසුට්ඨු පහීණත්තා භගවං අරහං මතො

යනුහෙයින්ම කියනලදී—සර්වප්‍රකාරයෙන් පරිශුද්ධසත්කායයන් ඇති ප්‍රහීණක්ලේශවූ භාවිතමාර්ගසාක්ෂාත්කෘතනිරෝධ ඇති ක්ෂීණාශ්‍රවශෛක්ෂක පෘථග්ජනාඛ්‍ය සුප්‍රතිපන්න පුරුෂ විශේෂයන් විසින් සෙවියයුතු බැවිනුත් අර්හත් නම් වනසේක.

යෙ සච්ඡිකතසද්ධම්මා අරියා සුද්ධගොචරා
න තෙහි රහිතො හොති නාථො තෙනාරහම්මතො

යනුහෙයින්ම කියනලදී—තවද බුදුහු බෝධිමූලයෙහිදීම කර්මක්ෂයකර ආර්යමාර්ගඥානයෙන් සර්වප්‍රකාරයෙන් සසම්භාර කර්මතත්‍වය විධ්වංශනය කළ හෙයින් නානාගතිභ්‍රමණයයි කියනලද චක්‍රසංඛ්‍යාත සංසාරගමනය නැති බැවිනුත් අර්හත් නම් වනසේක.

රහො වා ගමනං යස්ස සංසාරෙ නත්ථි සබ්බසො
පඤ්ඤජ්ජනමාරණො අරහං සුගතො මතො

යනුහෙයින්ම කියනලදී—අනන්තවූ ශීලසමාධිප්‍රඥා විමුක්තිවිමුක්තිඥානදර්ශනාදී අනන්‍යසාධාරණ යථාභූත ගුණාධිගත සදෙවකලෝකයෙහි සුප්‍රතිෂ්ඨිතවූ ප්‍රශස්තභාවයෙන් දිව්‍යමනුෂ්‍යාදි පණ්ඩිතජනයන් විසින් ප්‍රශංසා කටයුතුබැවිනුත් අර්හත් නම් වනසේක.

ගුණෙහි සදිසො නත්ථි යස්මා ලොකෙ සදෙවකෙ
තස්මා පාසංසියත්තාපි අරහං දිපදුත්තමො

යනුහෙයින්ම කියනලදී—මේ ටීකායෙහි ආ අර්ථ පස්පනතියයි.

සම්මාසම්බුද්ධො යන තන්හි,

අත්ථුපනතමනිතමබ්භූපෙතං
චරමචරං ක්ෂයමක්ෂයඤ්ච ඥෙය්‍යනාම්,
යත්‍ථෙහ බුබුධෙ සබොධිමූලෙ
බුද්ධමභිතො භගවානතස්සබුද්ධඃ

යත්‍ථුහෙයින් අවිපරීතකොට පරප්‍රත්‍යය නො වී ස්ව ලක්‍ෂණ සාමාන්‍ය ලක්‍ෂණ වශයෙන් විශිෂ්ටඥාන යෙන්දතයුතු චතුස්සත්‍යධර්ම, ත්‍රනතවූ භූත භව්‍යත් වර්තමාන ස්ථාවරජංගමනිත්‍යානිත්‍යාදි සකලඥෙය මණ්ඩලය කරතලාමලක ක්‍රමයෙන් අවබොධය කළ බැවින් “ දිස්සිතො න දදූති ” යන තන්ති මෙන් අවිද්‍යෙක්ෂණාපෙක්ෂයෙන් නිරවශෙෂපයයාදනය හෙතුකොට ගෙණ ‘සර්වාන් බුද්ධවාන්’ යනවාක්‍යයෙහි සර්වඥපදවූද අධ්‍යාහාරපදද ‘ බුධ අවගමනෙ’’ යන ධාතුනු කෙරෙන් බහුලප්‍රවිධානයෙන් “ගත්‍යර්ථානාපත්‍ය දුබාරෙව’’ යන සූත්‍රයෙන් කර්තෘකාරකයෙහි ක්ත ප්‍රත්‍යයෙන් නිෂ්පන්න කෘදන්ත නාම වශයෙන් බුද්ධනු සම්‍යක්සම්බුද්ධ නම් වනසේක්-ඇලිත් බුජ්ඣිතා සච්චානීති, බුද්ධො-බොධෙතා පජායාති බුද්ධො- සබ්බඤ්ඤුතාවිතාය බුද්ධො-අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො-විසවිතාය බුද්ධො-ඛීණාසවසංඛාතෙන බුද්ධො-නිරූපක්කිලෙසසංඛාතෙන බුද්ධො-එකන්තවීතරාගොති බුද්ධො-එකන්තවීතදොසොති බුද්ධො-එකන්තවීතමොහොති බුද්ධො-එකන්තනික්කිලෙසොති බුද්ධො-එකායනමග්ගං ගතොති බුද්ධො-එකො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති බුද්ධො-අබුද්ධිවිහතත්තා බුද්ධිපටිලාභත්තා බුද්ධො-යනාදීන් නිද්දෙස පාඨයෙහි නිර්දිෂ්ටාර්ථ ප්‍රභෙද යෙනුත් සම්‍යක්සම්බුද්ධ නම් වනසේක්.

විජ්ජාචරණසම්පන්නොතියන තන්ති විජ්ජා නම්

විපස්සනාඤාණමනොමයිද්ධි.
ඉද්ධිප්පභෙදොපි ච දිබ්බසොතං
පරස්ස චෙතොපරියායඤාණං
පුබ්බෙනිවාසානුගතඤ්ච ඤාණං
දිබ්බඤ්ච චක්ඛාසවසංඛයො ච
එතානි ඤාණානි ඉධට්ඨ විජ්ජා
අලඞ්කරුං යා මුනිධම්මදෙහං
විසෙසසොභා ගුණමජ්ඣුපෙතා

යනුහෙයින් විදර්ශනාඥානය, මනෝමයඍද්ධිඥානය, ඍද්ධිවිධඥානය, දිව්‍ය ශ්‍රොත්‍රඥානය. පරචිත්තඥානය, පූර්වෙනිවාසානුස්මෘතිඥානය. දිව්‍යචක්ෂුර්ඥානය, ආශ්‍රවක්ෂයඥානය, යන මේ අෂ්ටවිධඥාන යයි-මේ අෂ්ටවිධඥානය, සර්වඥය විදිතකරණාවියෙන් අෂ්ටවිද්‍යා නම් වේ-මේ අෂ්ටවිද්‍යාවන අතුරෙන් ප්‍රථමොද්දිෂ්ටවූ විදර්ශනාඥානයතෙම-උදයව්‍යයානුදර්ශනාඥානය, භඞ්ගානුදර්ශනාඥානය, භයතුපට්ඨානඥානය, ආදීනවානුදර්ශනාඥානය. නිර්වේදානුදර්ශනාඥානය මුඤ්චිතුකම්‍යතාඥානය, පටිසංඛානුපස්සනාඥානය, සංඛාරුපේක්ෂාඥානය, සත්‍යානුලොමඥාන යයි කියා නවවැදෑරුම්වේ. මේ නවවැදෑරුම්වූ විදර්ශනාඥානයන් අතුරෙන් උදයව්‍යය ඥානයනම්-මේ නාමරූපයාගේ උත්පත්තියට පූර්වභාගයෙහි එක්තැනෙක්හි රාශි භූතව සිටීමකුත් නැත, පහළවන්නාහූගේ රාශියකාස්ට එනගමනකුත් නැත, නැසෙන්නාහූගේ දිශානුදිශාවකට යාමකුත් නැත, නැසුනුකල්හි එක්තැනක රැස්ව සිටීමකුත් නැත. විණායනා කරණකල්හි, පගලඝණ්ඩය පළමුතැනෙක රැස්වසිටියේත් නොවේ, වෙන තැනක සිට අවුත් පහළවූයේත් නොවේ, නිරුද්ධව අනිත්තැනකට ගියේත් නොවේ, වැලිකෙසේද? වීණාය උපවිණාය පුරුෂයාගේ තදනුරූපවූ ව්‍යායාමය යන මෙකී කාරණයෙන් පෙර නැතිව ඇතිවියේද, එපරිද්දෙන් සියලු රූපාරූප ධර්මයෝ නැතිව ඇතිවන්නාහ,

ඇතිව නැතිවන්නාහු යයි යනාදීන් පවත්නා ඤාණ යයි.

භඞ්ගානුදර්ශනඥානය නම්, යම්සේ ඇස්ඇති පුරුෂයෙක් ගංතෙරක හෝ තෙරක පොකුණුතෙරක සිටියේ මහපොදඇති වැසි වස්නාකල්හි දියපිට මහත් මහත් බුබුළු නැගී සීඝ්‍ර සීඝ්‍රව බිඳෙනසේක් දකීද, එපරිද්දෙන් සියලු සංස්කාරධර්මයෝ බිඳෙති බිඳෙතියි දක්නාවූ ඤාණයයි.

භයතුපට්ඨාන ඤාණය නම් සියලු සංස්කාරධර්මයන් භංගානුපස්සනා වශයෙන් භාවනාකරනනාවූ යොගාවචරයාහට සියලු භවයොනිගතිස්ථිතිසත්වාවාසගතවූ සංස්කාරධර්මයෝ සැපසේ ජීවත්වනු කැමති භීරුකපුරුෂයෙක්හට සිංහව්‍යාඝ්‍රයක්ෂරාක්ෂසාසිවිසාදීන් මෙන් වැටහෙද්ද, එබඳුවූ ඤාණයයි.

ආදීනවානුදර්ශනඥානයනම්, මෙසේ භයතුපට්ඨාන ඥානය ආසෙවනය කරන්නාවූ පුරුදුකරන්නාවූ යොගාවචරයාහටම රමණීයාකාරයෙන් පිහිටියාවූ සිංහව්‍යාඝ්‍රාදි චණ්ඩසත්වාධිෂ්ඨිතවනගහණයක් මෙන්ද, රාක්ෂසපරිගෘහීත පුෂ්කරණියක් මෙන්ද, කඩුගත්අත්ඇති ශත්‍රැ භටයන් මෙන්ද, විෂ මිශ්‍ර භොජනයක් මෙන්ද, ගිනිගත් ගෙයක් මෙන්ද, සියලු සංස්කාරධර්මයන් උපද්‍රවාකාරයෙන් වැටහෙන්නාවූ ඤාණයයි.

නිර්වේදානුදර්ශනඥානයනම්, යම්සේ චිත්‍රකූටපර්වත ප්‍රාන්තයෙහි ඇලී වාසයකරන්නාවූ ස්වර්ණ හංස රාජයෙක් අපවිත්‍රවූ චණ්ඩාලග්‍රාමචාරයෙහි ගව්ර වළෙක ඇලී වාසය නොකෙරේද, එපරිද්දෙන් සියලු සංස්කාරධර්මයෙහි නිර්වේදාකාරයෙන් පවත්නාවූ ඤාණයයි.

මුඤ්චිතුකාම්‍යතාඥාණයනම්, දැලෙහි බැඳුනු මත්ස්‍යයෙකුමෙන්ද, සර්පමුඛයට පැමිනි මණ්ඩුකයෙකුමෙන්ද, මැදිරියක ලූ වනපක්ෂියෙකු මෙන්ද, ගරුඬමුඛ

යට පැමිනි නාගරාජයෙකුමෙන්ද, රාහුමුඛගතචන්ද්‍රයා මෙන්ද, සියලු සංස්කාරධර්මයන් කෙරෙන් මිදෙනු කැමතිව පවත්නා ඥානයයි. යම්සේ, මත්ස්‍යග්‍රහණය පිණිස දියට බට පුරුෂයෙක් මත්ස්‍යයෙක යන සංඥයෙන් කෘෂ්ණසර්පයාගේ ග්‍රීවය තරකොට අල්වාගෙණ “මහාමත්ස්‍යයෙකු ලදිමි”යි සතුටුව දියෙන් ඔසවා බලා සොවැතිතුණ දක ගිතව දෙපෂ දක කලකිරි ගැලවීයනුකැමතිව හරණට උපාය කරණුයේ වාලධිය අගපටන් අතවෙලාගත් දරණ මුදා අත ඔසවා වාලධිය හෙණ දෙතුන්විටෙක ඉසවට කරකවා දුබල කොට “යා දුෂ්ටසර්පය”යි, දුරදමා ගුහුව ගොඩනැගී “මහත් විෂඝෝර සර්පමුඛයෙකින් ගැලවීගියෙමි”යි ආපසු බලමින් සිටීද, එපරිදෙන් මෙහි යොගාවචරයා පළමුවෙන් ආත්මභාවය ලැබ සතුටුවූ කාලය දියයටදී “මත්ස්‍යයෙකු අල්වාගතිමි”යි සතුටුවූවාක් මෙනි, අනිත්‍යය දුක්ඛය අනාත්ම යයි ත්‍රිලක්ෂණය දුටුවා සොවැති තුණ දුටුවා මෙනි, සංස්කාරධර්මයෙහි භය ඥානය පහළවීම සර්පයා දක භයගත්කාලය මෙනි, ආදිනවානුදර්ශනඥානය සර්පයාගෙන් වන උපද්‍රවය දුටුවාක්මෙනි, නිර්වේදඥානය සර්පයා කෙරෙහි කලකිරුණාක් මෙනි, භවයෙන් මිදෙනු කැමති මුචිතුකාම්‍යතාඥානය සර්පයා කෙරෙන් මිදෙනුකැමතිවූවාක් මෙනි, පටිසංඛානුපස්සනා ඥානය ඒපුරුෂයා සර්පමුඛයෙන් මිදීමට උපාය කළාක් මෙනි.

සංඛාරුපෙක්ඛාඥානය නම්, යම්සේ ගින්නට දැමූ කුකුළු පියාපිය ආපස්සට කරකැවෙනු මිස ගිනී දිශාවට නොයේද, එපරිදෙන් සියලු සංස්කාරධර්මයන් කෙරෙහි නොඇලී මධ්‍යස්ථාකාරයෙන් පවත්නා ඥානයයි.

සත්‍යානුලොමඥානය නම් යම්සේ ධර්මිෂ්ඨවූරජෙක් අධිකරණ විනිශ්චය ස්ථානයෙහි උන්නේ අධිකරණ

නායකයන් අටදෙනෙකු කළ පූජනීය විනිශ්චය අසා ජ්‍යොතිෂයෙන් අගනෑවට නොගොස් මැදහත්ව අධික රණනායකයන් අටදෙනාටද පූර්වරාජධර්මියටද අනු කූලව විනිශ්චය කළනියා යගපතැයි අභිමතවේද ! එපරදෙදන් මේ යථොක්තව උදයව්‍යයාද් අෂ්ට විදර්ශනා ඥානය හට සත්තිස්බොධිපාක්ෂිකධර්මයන්ට අනු කූලව පවතනා ඥානයයි.

මනොමයඍද්ධි ඥානයනම්, මුදුනණ පදූරකින් තණ ගොබක් උදුරන්නාක් මෙන්ද කොපුවකින් කඩුවක් හයාගන්නාක් මෙන්ද කරඬුවකින් සර්පයෙකු නික්ත්කරන්නාක් මෙන්ද මේශරීරයෙන් රූපවත්වූ මනොමයවූ සර්වාංගප්‍රත්‍යංගයෙන් යුක්තවූ සංස්ථාන වශයෙන් අඩුකළවූ චක්ෂුරාදී ඉන්ද්‍රියයන් ඇති අන් ශරීරයක් නිර්මාණ කිරීමට සමර්ථවූ ඥානයයි. ඍද්ධිවිධ ඥානය නම්, ආවිර්භාවතිරොභාවාදී අනෙකප්‍රකාරවූ ඍද්ධි කොට්ඨාසයන් ප්‍රත්‍යක්ෂකරන්නාවූ ඥානයයි.

අණිමා ලඝිමා ප්‍රාප්තිඃ ප්‍රාකාම්‍යංමහිමා තථා
ඊශිතා වශිතා චෛව යත්‍රකාමාවශායිතා

මෙහි සූක්ෂමවූ, රූප නිර්මාණයද ශරීරය සූක්ෂමභාවයට පමුණුවා අදෘශ්‍යනයට යාමද අණිමත් නම් වේ- ආකාශයෙහි යාම්ඊම් ආදියට යොග්‍යකොට ශරීරය ලඝුබවට පැමිණවීම ලඝිමත් නම් වේ-දිව්‍ය බ්‍රහ්මලොකාදී යම් කිසි තැනකට වෙහෙස නැතිව ඇඟිල්ලකින් යම ප්‍රාප්ති නම් වේ-අධිෂ්ඨානජ්ඤානීවණ මනොමයද්ධි වශයෙන් ඊප්සිතාර්ථනිෂ්පාදනය ප්‍රාකාම්‍ය නම් වේ-ආකාශයෙහි සථ්‍යන නිශද්‍යාදී ඉදිරියව් පැවැත්වීමද හිරසඳ අත්ලෙන් පිරිමැදීම් ආදියද, ශරීරය මහත්බවට පැමිණවීමද, මහිමත් නම්වේ-සර්වයං ජනතාවෙහි ඉසුරුබව ඊශිතා නම් වේ-සෘද්ධ්‍යාදියෙහි වශීභාවය වශිතා නම් වේ-ආකාශයෙහි යන්නාහුගේ

හෝ අන් යම් කිසිවක් කරන්නහුගේ හෝ නිෂ්පා
දනය, යත්‍රකාමාවසායිතා නම් වේ-මේ යශොභාග්‍ය
ලොකාග්‍රනිත අෂ්ටමහාඝිය බුදුන්ගේ ඓශ්වර්ය ඥාන
යෙන්ම අනාගීතයි.

දිව්‍ය ශ්‍රොත්‍රඥානයනම්, දිව්‍යවූද මානුෂිකවූද දූර
ස්ථවූද සමීපස්ථවූද ශබ්ද ශ්‍රවණයට සමර්ථවූ ඥාන
යයි. පරචිත්තවිජානනඥානයනම්, තමාගේ චිත්ත
යෙන් අනුන්ගේ චිත්තය සරාගාදිසොළොස් ආකාර
යකින් පිරිසිඳ දන්නා නුවණයි. පූර්වේනිවාසානු
ස්මෘතිඥානයනම් - නාමගොත්‍රාදී වශයෙන් තමා
ගේද අනුන්ගේද පෙර විසූ කදපිළිවෙළ දන්නා
නුවණයි. දිව්‍යචක්ෂුර්ඥානයනම්-දිවැසින් සත්වයන්
ගේ චුතිඋත්පත්ත්‍යාදිය දක්නා නුවණයි. ආශ්‍රවක්ෂය
ඥානයනම්-දුඃඛ සමුදය නිරොධ මාර්ග යන චතුරාර්‍ය
සත්‍යයන් තත්වූ පරිද්දෙන් සොළොස් ආකාරයකින්
දැනගන්නා අර්හද්මාර්ගඥානයයි. මේඅෂ්ටවිධඥානය,
ස්වවිෂය විදිතකරණාර්ථයෙන් අෂ්ටවිද්‍යානම් වේ.
විදිතං කරොන්තීති විජ්ජා-වෙදනං විජානාති එතාය
වාති විජ්ජා-වින්දියං විඥන්ති විජ්ජා-යථාවතො උප
ලබ්භන්ති අත්ථෝ. අත්තනො වා පටිපක්ඛස්ස විජ්ඣ
නෙන විජ්ජා-තමොක්ඛන්ධපදාලනාදිකස්ස පදාලනත්ථෙ
නාති අත්ථො, තතො එව අත්තනො විසයස්ස විදිත
කරණත්තෙනාපි විජ්ජා.

චරණනම්.

සීලං වරං ඉන්ද්‍රියසංවරො ච,
මත්තඤ්ඤුතා ජාගරියානුයොගො
සද්ධා හිරොත්තප්පබහුස්සුතත්තං,
පරක්කමො චෙව සති මති ච,
චත්තාරි ඣානානි ච තානිමානි,
තිපඤ්චධම්මා චරණානි ජඤ්ඤා
එතෙහි විජ්ජාහි ච සම්පයොගා
සම්පන්නවිජ්ජාචරණො මුනින්දො-ති

යන්නෙහසින් සිලසංවරය ඉන්ද්‍රියයෙහි ගුප්තවාර බවය භොජනයෙහි මාත්‍රඥබවය ජාගරියානු යොගය ශ්‍රද්ධා හ්‍රී අපත්‍රපා බාහු ශ්‍රැත්‍ය වීය්‍ය ස්මෘති ප්‍රඥ යන මේ එකොලොස හා රූපාවචරධ්‍යාන සතරය යනමේ පසලොසයි. මෙසේ:

නවකොටි සහස්සානි අසීතිං සතකොටියො
පඤ්ඤාසං සතසහස්සානි ඡත්තිංසා ච පුනාපරෙ

එතෙ සංවරවිනයා සම්බුද්ධෙන පකාසිතා
පෙය්‍යාලමුඛෙන නිද්දිට්ඨා සික්ඛා විනයසං‍ගරෙ

යනාදීන් දක්වනලද නවකෙළදහස් අසූසියක් කෙළ පණස්ලක්ෂ සතිස් මහාසංවරසීලය, සීල සංවර නම් වේ-රූප ශබ්දාදී ෂඩාලම්බනයෙහි එළඹ උපදනා ලොභ ද්වෙෂ මොහයයි කියනලද කෙලෙස් සොරුන් දුරුකොට ඔවුන් චක්ෂුර්වාරාදී සදොරින් වැදදනොදී ස්මෘතිකවාටය වසා සිත්හුවක්හි ත් යෙදී විසීම ඉන්ද්‍රියෙහි ගුප්තවාරබව නම් වේ-භූජීතව්‍යවී යෙත් භොජන නම්වූ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන චතුර්විධ ප්‍රත්‍යයන්ගේ පමණ පරි භොග ප්‍රතිග්‍රහණ පරියෙසනාදිය භොජනයෙහි මාත්‍රඥබව නම් වේ-භාවනාදියෙහි යෙදීමෙත් නිදි වරා තුනුවණ දුරුකිරීම ජාගරියානු යොගය නම් වේ. ශම්ත ශෛවාල පංකයන් ඇතිකොට දිය පහදවන් නාවූ උදකප්‍රසාදක මාණික්‍යයක් මෙන් සහ ජාත චිත්තචෛතසිකධර්මයන්ප්‍රශන්නකරන්නාවූ සොහ නාධ්‍ය චෛතසික ධර්මය ශ්‍රද්ධා නම් වේ-පාපයෙහි ජිගුප්සාකාරයෙන් පවත්නාවූ ලජ්ජාව හ්‍රීනම් වේ-පා පයෙහි භයාකාරයෙන් පවත්නාවූ ඔත්තප්පය අපත්‍ර පානම් වේ - ලොව ඇති සියලු ශාස්ත්‍ර දැනීම බාහු ශ්‍රැත්‍ය නම් වේ-භාරොවහනයෙහි ධූරවාෂහයෙකු මෙත් කුශලධර්මයන්ට මනාකොට ප්‍රයොග කිරීමෙහි

උත්සාහය "වීර්‍ය්‍ය" නම් වේ-ප්‍රගුණග්‍රන්ථයන් මෙන් ආලම්බනානුස්මරණය කරන්නාවූ සිහිය සමාධි නම් වේ-ත්‍රෛභූමිකසංස්කාරධර්මයන් අනිත්‍යාදි වශයෙන් අනෙකප්‍රකාරයෙන් දැනගන්නාවූ ඥානය "ප්‍රඥා" නම් වේ-මේ ධර්මයන් එකොළොස්දෙනාහා රූපාවචරධ්‍යානයෝ සතරදෙන "පසළොස්චරණධර්ම" නම් වෙත්.

"පාදග්‍රං ප්‍රපදං පාදඃ පදඞ්ඝ්‍රිශ්චරණෝ' ස්ත්‍රියාම්" යනු නිඝණ්ටු හෙයින්, මෙතැන්හි "චරණ නම්" පාදයි-අරියසාවකො එතෙහි චරති අමතං දිසං ගච්ඡතීති=චරණං-විජ්ජා ච චරණං ච=විජ්ජාචරණං-සමන්නාගතො පන්නො පත්තො පුණ්ණොති=සම්පන්නො, අථවා, සම්මදෙව පන්නො ගතො උපගතොති=සම්පන්නො-විජ්ජාචරණෙහි සම්පන්නො=විජ්ජාචරණසම්පන්නො, බුදුනු පූර්වෝක්තදිෂ්ටවූ අෂ්ටවිද්‍යාවෙන් හා මෙකී පසළොස්චරණධර්මයෙන් යුක්තවූහෙයින් සම්පූර්ණවූ හෙයින් "විජ්ජාචරණසම්පන්න" නාම් වනසේක්.

"විපස්සනාඤාණමනොමයිද්ධි
ඉද්ධිප්පභෙදො'පි ච දිබ්බසොතං
පරස්සචෙතො පරියායඤාණං
පුබ්බෙනිවාසානුගතඤ්ච ඤාණං.
දිබ්බඤ්ච චක්ඛාසවසඞ්ඛයො ච
එතානි ඤාණානි ඉධට්ඨවිජ්ජා
අලංකරුං යා මුනිධම්මදෙහං
විසෙසසොභා ගුණමජ්ඣුපෙතා."

මේ අෂ්ටවිද්‍යා සඞ්ග්‍රහ ගාථා දෙකයි.

"සීලං වරං ඉන්ද්‍රියසංවරො ච
මත්තාසිතා ජාගරියානුයොගො
සද්ධාහිරොත්තප්පබාහුස්සුතත්තං
පරක්කමො චෙව සතී මතී ච."

"චත්තාරි ඣානානි ච තානිමානි
තිපඤ්ච ධම්මා චරණානි ජඤ්ඤා,
එතෙහි විජ්ජාහි ච සම්පයොගො
සම්පන්නවිජ්ජාචරණො මුනින්දො"-යි

මේ පසළොස්චරණධර්මසඞ්ග්‍රහ ගාථා දෙකයි.

"සුගතො" යන නන්හි බුදුහු සොභනගති සඞ්ඛ්‍යාත විශුද්ධාර්‍ය්‍යමාර්ගයෙන් නිර්වාණයට ක්ෂිප්‍රාභිඥාවශයෙන් ගිය හෙයින් "සුගත" නම් වනසේකි. නවද දීපඞ්කර පාදමූලයෙහි පටන් බොධිමූලය දක්වා සමතිංශත් පාරමී ධර්මයන් පූරණයේක් අවිපරීතප්‍රතිපත්තියෙන් සියලු සත්ත්වයන්ට හිතසැප එලවමින් ශාස්වතොච්ඡෙද කාමසුඛ ආත්මකලමථ යන චතුරන්තයට නොගොස් ආර්‍ය්‍යමාර්ග ගතියෙන් මනාකොට ගිය බැවිනුත් "සුගත" නම් වනසේකි. නවද සකල සංස්කාරප්‍රවෘත්තීන්ගේ අභාවයෙන් ඒකාන්ත සුන්දර වූ අමෘතමහානිර්වාණයට ගියහෙයිනුත් සුගත නම් වනසේකි. නවද තත්තන්මාර්ගයෙන් ප්‍රහීණ කලේශයන් අපුනරාවෘත්තිකරණවශයෙන් මනාකොට ගිය හෙයිනුත් "සුගත" නම් වනසේකි. නවද දූඃකන වචනයක් නිෂ්පාද්‍ය කළ කල්හි සත්‍යසාර්ථප්‍රියවචනයන් කථනය කරණ හෙයිනුත් "සුගත" නම් වනසේකි. නවද ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණාශීත්‍යනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභාකේතුරශ්මිතරූප කායසම්පත්තියක් ඇති හෙයින් ද්‍රැතවිලම්බිතස්ඛලිතානුකර්ෂණනිෂ්පීඩ නොනතකුටිලාකුලතාදි දොෂ රහිතව අපහසිත රාජහංස වෘෂභවරවාරණමෘගරාජ ගමනවිලාසඇති සොභනාවූ කායගමනින් යුක්තහෙයිනුත් "සුගත" නාම් වන සේකි.

මෙහි "ද්වාත්‍රිංශද්වරමහාපුරුෂලක්ෂණ" නම් කවර යත්? සුප්පතිට්ඨිතපාදො-හෙට්ඨා පාදතලෙසු චක්කානි ජාතානි සහස්සාරානි සනෙමිකානි සනාභිකානි

සබ්බාකාරපරිපූරණි-ආයතපණ්හී-දීඝඞ්ගුලී-මුදුතළුනහත්ථපාදෙ-ජාලහත්ථපාදෙ-උස්සංඛපාදෙ-ඒණිජංඝො-ඨිතකො අනොනමන්තො උභොහි පාණිතලෙහි ජණ්ණුකානි පරිමසති පරිමජ්ජති-කොසොහිතවත්ථගුය්හො-සුවණ්ණවණ්ණො කඤ්චනසන්නිභත්තචො-සුඛුමච්ඡවි, සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උපලිම්පති-ඒකෙකලොමො, ඒකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි-උද්ධග්ගලොමො, උද්ධග්ගානි ලොමානි ජාතානි නීලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලාවත්තානි පදක්ඛිණාවත්තකජාතානි-බ්‍රහ්මුජ්ජුගත්තො-සත්තුස්සදෙ-සීහපුබ්බද්ධකායො-චිතන්තරංසො-නිග්‍රොධපරිමණ්ඩලො-යාවතක්වස්ස කායො තාවතක්වස්ස ව්‍යාමො යාවතක්වස්ස ව්‍යාමො තාවතක්වස්ස කායො-සමවත්තක්ඛන්ධො-රසග්ගසග්ගී-සීහහනු-චත්තාරීසදන්තො-සමදන්තො-අවිවරදන්තො-සුසුක්කදාඨො-පහූතජිව්හො-බ්‍රහ්මස්සරො කරවීකභාණී-අභිනීලනෙත්තො-ගොපඛුමො-උණ්ණා භමුකන්තරෙ ජාතා ඔදාතා මුදුතූලසන්නිභා-උණ්හීසසීසො-යි.

මෙහි "සුප්පතිට්ඨිතපාදෙ" යන තන්හි "සුප්‍රතිෂ්ඨිතපාද" නම් කවර යත්? අනුන් පතුල් බිම තබනකාල අග්පතුලහෝ විළුඹ හෝ පාශ්වය හෝ පළමුකොට භූමිය ස්පර්ශ කෙරේ, පාදතලමධ්‍යයෙන් ඡිද්‍ර හෝ වෙයි, පත්ල නගනකලත් අග්‍රපාදතලාදීන් කෙරෙන් අන්‍යතරස්ථානයෙක් පළමුකොට නැගේ, ඒ බුදුන් පතුල්වූකල සවර්ණපාදුකාසෙයින් එකපැහැර භූමිස්පර්ශ කෙරේ, එකපැහැර නැගේ, ඉදින් බුදුහු අනේක ශතපෞරුෂ නරකප්‍රපාතයෙහි "ඈත්මෙමිසි, (තබමි")යි, ශ්‍රීපාදය එයට එලවූසේක් ඒනාම් එම විගස වළතැන් වයින් පිරුණු හස්ත්‍රාසෙයින් (කඹුරුසම්සෙයින්) පිරේ, ගොඩතැන් හෙරිතලසෙයින් සම

වේ, "දුර ඇත්තෙමි යි, දුරතබමි"යි, ශ්‍රීපාදය නැගු සේක් වීනම් යමකප්‍රාතිහාර්‍ය්‍යාවසානයෙහි සෙයින් මෙරුප්‍රමාණ පර්වතය කුදු හුයා පි වෙඃගබඩන්සෙයින් නැමී ශ්‍රීපාදය සමීපයට උපගත වේ, (ලංවේ.)

"නිතානං ඨානං උන්නමති ගච්ඡන්තෙ ලොකනායකෙ
උන්නතං ච සමං හොති පඨවී ච අචෙතනා.
පාසාණා සක්ඛරා චෙව කඨලා ඛාණුකණ්ටකා,
සබ්බෙ මග්ගා විවජ්ජෙන්ති ගච්ඡන්තෙ ලොකනායකෙ
ගච්ඡතො බුද්ධසෙට්ඨස්ස හෙට්ඨා පාදතලං මුදු,
සමං සම්ඵුසතෙ භූමිං රජසානුපලිම්පති.
නාගවික්කන්තචාරෝ සො ගමනෙ සොභාත ජිනෙ,
චාරුං ගච්ඡති ලොකග්ගො හාසයන්තො සදෙවකෙ."
(යනු ඒහෙයින්ම කියනලදී)

මෙසෙයින් සුප්‍රතිෂ්ඨිතවූ පාදතලවය ඇතිවන බැවින් "සුප්‍රතිෂ්ඨිතපාද" නම් වෙත් බුදුහු.

"හෙට්ඨා පාදතලෙසු චක්කානි ජාතානි" යනාදීතන්හි "චක්‍රයෝ"නම් කවරහයත්? බුදුන් ශ්‍රීපතුල් දෙක්හි දහස් දහස් දැවිඇති නිම්නැබිසහිත දෙචක්‍රයෙක් චී, ඒ වටා-සවස්තිකය-ශ්‍රීවත්සය-නනාද්‍යාවර්තනය-සෞවස්තිකය-අවතංශකය-වර්ධමානකය-භද්‍රපීඨකය-ප්‍රාසාදය-තොරණය-ශ්වේතච්ඡත්‍රය-ඛඩ්ගය-තාලවෘන්තය-මයූරහස්තය—චාමරය-උෂ්ණීෂය-මණිය-සුමනදාමය-නීලොත්පලය-රක්තොත්පලය—රක්තපද්මය-ශ්වේතපද්මය-පූර්ණකලසය-පූර්ණපාත්‍රය-සමුද්‍රය-චක්‍රවාටපර්වතය-හිමාලයපර්වතය මෙරුපර්වතය-සූර්යමණ්ඩලය-චන්ද්‍රමණ්ඩලය-සපරිවාරසතරමහාද්වීපය-සපරිසප්තරත්නචක්‍රවර්තීය-දක්ෂිණාවෘත්තශ්වේතසඛ්ඛය-ස්වර්ණමත්ස්‍යයුගලය-චක්‍රායුධය-සප්ත මහාගඞ්ගාය-සප්ත මහාශෛලය-

සප්තමහාහ්‍රදය-සුපර්ණරාජය-ශිශුමාරය-ධ්වජය—
පතාකාය-සවර්ණසිබිකාය-සවර්ණවාලවීජනය-
කෛලාසපර්වතය-සිංහරාජය—ව්‍යාඝ්‍රරාජය—වලාහ
ක අශ්වරාජය-උපෝසථ හස්තිරාජය-වාසුකිනාගරා
ජය-හංසරාජය-වෘෂභරාජය-ඓරාවතහස්තිරාජය-
සවර්ණ මකරය-චතුර්මුඛස්වර්ණනෞකාය-සව
ත්සකධේනුය-කිම්පුරුෂය-කින්නරිය-කුරවීකය-
මයුර රාජය-ක්‍රෞංචරාජය-චක්‍රවාකරාජය-ජීවංජීව
කරාජය-ෂඩ්විධදිව්‍යලෝකය—ෂෝඩශවිධබ්‍රහ්මලෝ
කය-යන මේතෙක් මඞගලලක්ෂණයෝ පෙනේ
ත්.

මෙ සෙයින් බුදුන් ශ්‍රීපතුල් දෙක්හි දහස් දහස් දූ
විඅැති නිම්නැබි සහිත දෙසියසොළසක් මඟුල්ලකු
ණු පිරිවරණලද දෙවක්‍රලක්ෂණයෝ "චක්‍ර" නම්
වෙත්.

"ආයතපණ්හි" යන තන්හි ආයතවූ "පාෂ්ණි" නා
මී කවරහයත්? සම්පූර්ණවූ දික් විළුම්, සෙසසන් අත්
පතුල්දික් වේ, විළුඹ්මුදුනෙහි සිහින් කතුල් වේ, විළු
ම්සැසපිටා වැනි වේ, බුදුනට වූ කල එසේ නොවේ,
බුදුන් ශ්‍රී පත්ලෙහි සතර භාගයෙන් දෙභාගයෙක්
අත්පතුල් වේ, තුන්වන භාගයෙහි ජංඝාප්‍රතිෂ්ඨිත
වේ, සතරවන භාගයෙහි සිදිඅගින් වටාතුබුරකත
කඹලගොණ්ඩු කයක් බඳු විළුම් වේයි, මෙසෙයින් පි
රුණු දික්විළුම් ඇතිවන බැවින් "ආයතපාෂ්ණි"
නාම් වෙත්.

"දීඝඞ්ගුලී" යන තන්හි ඔවුන් දීඝාඞ්ගුලි පරිදි කි
සේයගත්? අනුන් ඇතම් ඇඟිලි දික්වේ, ඇතම් ඇ
ඟිලි ලුහුඩු වේ, බුදුන්ට වූ කල එසේ නොවේ, බුදුන්
හස්තපාදඞ්ගුලින්නු මකුළුවන් ඇඟිලි සෙයින් දික්ව මු
ලින් දලව ක්‍රමයෙන් ගොස් අගින් සිහින්ව නියසීාස
ගෙතලයෙන් අනාවැවූ සිරියෙල්වැටිසෙයින් නොසි

න්. මෙසෙයින් දික්වූ ඇඟිලි ඇතිවනබැවින් "දීඝාඞ්ගුලි" නම් වෙත්.

"මුදුතළුණහත්ථපාදො" යන තන්හි ඔවුන් මෘදුවූ තරුණවූ හස්තපාද ඇති පරිදි කියේයයත්? බුදුන් අතුල් පතුල් පහන් ගිතෙල ගලාතුබූ සියක්වරට පෙළ පුළුන් පෙදක්සෙයින් මොළොක් වේ, ජාතමාත්‍ර කුමාරයෙකුගේ (එවිගස උපන් පැටවෙකුගේ) අතල්පතුල්සෙයින් හැමකල්හි තරුණවේ, මෙසෙයින් මෘදුවූ තරුණවූ අතුල් පතුල් ඇතිවන බැවින් "මෘදුතරුණහස්තපාද" නම් වෙත්.

"ජාලහත්ථපාදො" යන තන්හි ඔවුන් ජාලහස්තපාද පරිදි කියේයයත්? සෙසු සත්වයන්ට ඌනපූර්ණ අත් ඌනපූර්ණපා වෙත්, බුදුන්ටවූකල අතසතර ඇඟිලිලෝද පය පස් ඇඟිලිලෝද එකප්‍රමාණව ඔවුනොවුන් විනිවිද සිටිත්, දක්ෂ වඩුවෙකුවිසින් යොදනලද ජාලකවුළුවක් වැනි වෙත්, මෙසෙයින් යුක්තවූ හස්තපාද ඇතිවනබැවින් "ජාලහස්තපාද" නම් වෙත්.

"උස්සංඛපාදො" යන තන්හි ඔවුන් උස්සංඛපාද පරිදි කියේයයත්? අනුන් ඉබාලට පිටිපසුවේ, එයින් ඔවුන් පා ඇණපටසෙයින් තද වේ, කැමතිසේ නොපිරිවැවේ, යනුවන් පතුල් නොපෙණේ, බුදුන්ට වූකල නැළිය මතෙහි ගුලඵයෝ (ගොප්මස්ගු) පිහිටියාහුයි, එහෙයින් වඩනා බුදුන් නාභිය පටන්ගෙණ උඩුව ශරීරය නැවතිසිටි රන්පිළිමයක් සෙයින් නිශ්චල වේ, අධඃකායම චලිත වේ, සුවයෙන් පාදයෝ පරිවර්තිතවෙත්, (පෙරළෙත්,) ඉදිරියෙහිද පිටිපසද දෙපසෙහිද සිට බලන්නවුන්ට පාදතලයෝ පෙණෙත්, ඇතුන් පතුල්සේ ඔවුන් පිටිපස සිට බලන්නවුන්ටම පෙණෙන්නේ නොවෙයි, මෙසෙයින් උද්ගතව ප්‍රතිෂ්ඨිතවූ ගුලඵයන් ඇතිවන බැවින් "උස්සංඛපාද" නම් වෙත්.

"එණිජංඝො" යන තන්හි ඔවුන් එණිජංඝ පරිදි කිසේයත්? බුදුන් ජංඝා හාත්පස්හි සමව සිටි මසින් පරික්‍ෂිප්තව මනාකොට වඩනාලද හැල්ගැබිසෙයින් පරිපූර්ණවන බැවින් එණිමෘගයන්ගේ ඕළුමුවන්ගේ ජංඝා වැනිහුයි ඔහු "එණිජඞ්ඝ" නම් වෙත්.

"ඨිතකො අනොනමන්තො" යනාදි තන්හි ඔවුන් සිට නොනැමී දෙදන පිරිමදනා පරිදි කිසේයත්? සෙස්සු සත්වයෝ කුදුහෝ වෙති, කුරුහෝ වෙති, කුදුන්ගේ ඌර්ධ්වකාය අපරිපූර්ණවේ කුරුන්ගේ අධඃකාය අපරිපූර්ණවේ, ඒ කුදුකුරු සත්වයෝ අපරිපූර්ණකායවන බැවින් සිට නොනැමී දෙදන පිරිමදනට අසමර්ථ වෙති, බුදුහු වූකල පරිපූර්ණ උභයකාය ඇතිවන බැවින් සිට නොනැමී දෙයත්ලෙන් දෙදන පිරිමදිනාසේකි.

"කොසොහිතවත්ථගුය්හො" යන තන්හි ඔවුන් කොෂයෙහි අවහිතවූ වස්ත්‍රගුහ්‍ය ඇතිපරිදි කිසේයත්? වෘෂභවාරණාදීන්ගේ අඞ්ගජාතසෙයින් බුදුන්ගේ පුරුෂව්‍යඤ්ජනය ස්වර්ණපද්ම කර්ණිකාවක්බඳු (රන්වන්පියුම් කෙමියක්වැනි) කොෂගර්භයෙහි අවහිතවේ, (ප්‍රච්ඡන්න වේ= සැඟවේ,) මෙම වස්ත්‍රයෙන් ගුහ්‍ය කටයුතුබැවින් වස්ත්‍රගුහ්‍ය නම් වේ, මෙසෙයින් කොෂයෙහි අවහිතවූ වස්ත්‍රගුහ්‍ය ඇතිවන බැවින් කොෂාවහිත "වස්ත්‍රගුහ්‍ය" නම් වෙත්.

"සුවණ්ණවණ්ණො කඤ්චනසන්නිභත්තචො" යන තන්හි ඔවුන් ස්වර්ණවර්ණ පරිදිහා කාඤ්චනසන්නිභත්වක් පරිදි කිසේයත්? බුදුහු දැගිහුලෙන් මැදදිවිදලින් කටා ගුරු පිරියම්කොට නිමවූ ඝන රන්පිළිමයක් සෙයින් රන්වන්වූ සිරුරුහා ඝන මටසිනිඳු කසුන් සාදක් සෙයින් පහන් සිවිපැහැ ඇතිවනසේකි.

"සුඛුමච්ඡවි" යනාදි තන්හි සියුම්සිවිඇති පරිදි කිසේයයත්? බුදුන් සිවි සියුම්ඇතිවන බැවින් ධූලි හෝ දූලි හෝ ශරීරයෙහි නොඇලේ පද්මපත්‍රයෙහි උදකබිඳු සෙයින් විවර්ණනොවේ අලපත (නෙලුම්පත) ගත් දියත්තක් සෙයින් නොරඳ, එතකුදු උවත් බුදුනු ඍතුග්‍රහණ සඳහාත් දායකයන්ට:පුණ්‍යඵල සඳහාත් මූත්‍රශිපියෙනුත් ශාගතපාදදිනු බොවනාය කොට වදාරණසේකි, මෙසේ සියුම් සිවිඇතිවනබැවින් "සුඛුමච්ඡවි" නම් වෙත්.

"එකෙකලොමො" යන තන්හි ඔවුන් එකි එකි ලොම් ඇති පරිදි කිසේයයත්? සෙස්සන් එක්කූපයෙන්හි රෝම දෙකෙක් තුණකුදු වෙත්; බුදුන්ට වූකල එකී එකී කූපයෙහි එකී එකී රෝමයෙක්ම වේ, එහෙයින් "එකෙකලොම" නම් වෙත්.

"උඬගලොමො" යන තන්හි ඔවුන් ඌර්ධ්වාග්‍ර රෝම් ඇති පරිදි කිසේයයත්? බුදුන්ගේ ශරීරයෙහි නිල්වූ අඤ්ජනවර්ණවූ රෝමයෝ දක්ෂිණාවර්තතව ආවෘතනිපයසී/වසානයෙහි ඌර්ධ්වාග්‍රව මුඛසොභා බලනුවන්සෙයින් සිටිත්, එහෙයින් බුදුහු "ඌර්ධ්වාග්‍ර රෝම" නම්වෙත්.

"බ්‍රහ්මුජ්ජුගතෙතා" යන තන්හි බ්‍රහ්මයාසෙයින් ඔවුන් ඍජුගාත්‍ර ඇති පරිදි කිසේයයත්? බොහෝ සත්වයෝ සකන්ධයෙන් හෝ නැමෙත්, කටිප්‍රදෙශයෙන් හෝ නැමෙත්, දණමඩලින් හෝ නැමෙත්, (පිටදිගාවට නැමෙත්, සකන්ධයෙන් හා දණමඩලින් නැමෙන්නාහු ඉදිරියට නැමෙත්, දීඝශරීර ඇති ඇතම් කෙනෙක් පාර්ශ්වයෙන් වක් වෙත්, උඩ බලා නක්ෂත්තරු ගණනවුන් සෙයින් ඇවිදිත්, ඇතම් කෙනෙක් අල්පමාංස රුධිරවන බැවින් ශූලසදෘශව වෙවුලමින් ඇවිදිත්, බුදුන්ට වූකල ඍජුව උදගතවූ ශරීරය

දිව්‍යපුරයෙහි නැගුරුවින් තොරණක් සෙයින් සො
භමාන වේ, මෙසේ මහාබ්‍රහ්මයාගේ ගාත්‍ර සෙයින්
ඍජුවූ දීර්ඝප්‍රමාණවූ ගාත්‍ර ඇතිවන බැවින් ''බ්‍රහ්මඍජු
ගාත්‍ර'' නම් වෙත්.

''සත්තුස්සදෙ'' යන තන්හි ඔවුන් සප්තස්ථානයෙ
කින් උත්සන්න පරිදි කියේයයත්? බුදුහු දෙඅත්
පිටය දෙපාපිටය දෙඅංසකූටය ස්කන්ධය යනමෙ ස
ප්තස්ථානයෙහි පරිපූර්ණවූ මාංසයෙන් උත්සන්න
වනසේකි, අන්සතුන්ගේ අත්පිටද පාපිට; නහර
වැල් පෙණේ, අංසකූටයෙහිද ස්කන්ධයෙහිද අස්ථි
කොටි පෙණේ ඔහු මනුෂ්‍යප්‍රේතයන් සෙයින් වැට
ගෙත්, බුදුහු වූකල එසේ නොවනසේකි, බුදුන්ට
මේ සප්තස්ථානයෙහි පරිපූර්ණවූ මාංසොත්සද
ඇතිවන බැවින් සැඟවී තිබෙන නහරවැල් වේ, රන්
මිහිඟු බෙරක් හා සමාන ස්කන්ධ වේ, එහෙයින් බුදු
හු ''සප්තොත්සද'' නම් වෙත්.

''සීහපුබ්බද්ධකායො'' යන තන්හි ඔවුන් සිංහයා
ගේ පූර්වාර්ධකාය මෙන් ශරීර ඇති පරිදි කියේයයත්?
සිංහයාගේ පූර්වාර්ධකායම පරිපූර්ණවේ පශ්චිම
කාය අපරිපූර්ණවේ බුදුන්ට වූකල සිංහයාගේ පූ
ර්වාර්ධකාය සෙයින් පශ්චිමකාය පරිපූර්ණවේ මෙසෙ
යින් සිංහයාගේ පූර්වාර්ධකාය සෙයින් පරිපූර්ණවූ
පශ්චිමකාය ඇතිවන බැවින් ''සිංහපූර්වාර්ධකාය''
නම් වෙත්.

''චිතන්තරංසො'' යන තන්හි ඔවුන් චිතවූ අන්ත
රාංශ ඇති පරිදි කියේයයත්? මෙහි අන්තරාංශ නම්
පිට දෙඅංශයන්ගේ මධ්‍යයයි, ඒ බුදුන්ට චිතයි පරි
පූර්ණයි, සෙසුසත්වයන්ට ඒ ස්ථානය නිම්න වේ, (වළ
වේ) පිට දෙභාගයෝ වෙන වෙන පෙණෙත්, බුදු
නට වූකල කටිප්‍රදෙශයෙ පටන් ගෙණ මාංස පටලයෙ
න් ස්කන්ධය දක්වා උද්ගතව නැගී රන්පුවරුවක්

සෙයින් පිට වසා පිහිටියේයි, මෙසෙයින් විතතවූ පරිපූර්ණවූ අනන්තරංස ඇතිවන බැවින් "විතානත රංශ" නාම් වෙත්.

"නිග්‍රොධපරිමණ්ඩලො" යන තන්හි ඔවුන් න්‍යග්‍රොධ පරිමණ්ඩල පරිදි කියේය යත්? යම්සේ පණස් රියන්වන බැවින් හෝ සියක් රියන්වන බැවින් හෝ සමවූ කඳ හා ශාඛා ඇති න්‍යග්‍රොධවෘක්ෂය දිගින්ද විස්තාරයෙන්ද සමප්‍රමාණ වේද එසේම බුදුහු කායින්ද බඹයෙන්ද සමප්‍රමාණ වන සේක, යම්පමණ කාය වේද, එපමණ ව්‍යාමය වේ, යම්පමණ ව්‍යාම වේද, එපමණ කායවේ, අන් සත්වයන්ගේ කාය හෝ දිඝ වේ, ව්‍යාමය හෝ දිඝ වේ, සර්වඥයන් වහන්සේගේ එපරිද්දෙන් විෂමප්‍රමාණ නොවෙතැයි මෙසෙයින් සමප්‍රමාණවූ කාය හා ව්‍යාමය ඇතිවන බැවින් "න්‍යග්‍රොධපරිමණ්ඩල" නාම් වෙත්.

"සමවත්තක්ඛන්ධො" යන තන්හි ඔවුන් සමවෘත්තස්කන්ධ ඇති පරිදි කියේයයත්? ඇතම් කෙනෙකුන් ව කොකුන් සේ සින් දික්වූ වක්වූ පලල්වූ ග්‍රීවා වේ ඔවුන් කථාකරණකල්හි ග්‍රීවයෙහි නහරවැල් පෙණේ, මඳව ස්වර නිග්ඝාත වේ, බුදුනට වූකල එසේ නොවේ බුදුන්ට සුවෘත්තවූ රන්කලසකරක්බඳු ග්‍රීවා වේ, බුදුන් කථාකර වදාරණකල්හි ග්‍රීවයෙහි නහරවැල් නොපෙණේ, මඳව ස්වර නිග්ඝාත වේ, මෙඝයන්හුගේ ගර්ජනාසෙයින් ගර්ජනාකරණ බුදුන්ගේ ස්වර මහත් වේ, මෙසෙයින් සමවටකඳ ඇත්ත වන බැවින් "සමවෘත්තස්කන්ධ" නාම් වෙත්.

"රසග්ගසග්ගී" යන තන්හි ඔවුන් රසග්‍රාසාග්‍ර පරිදි කියේයයත්? ලවණම්ල තික්ත කටුකාදි රසයන්ගේ ග්‍රාසය අදනයකරණ සෙයින් රසනාහර රසග්‍රාසග්‍ර වේ, ගේ රසනාහර අග්‍ර විනුයි රසග්‍රාසාග්‍ර වේ,

බුදුන්ගේ සත් සියයක් රස හරණීහු උද්ධාග්‍රව ග්‍රීව
යෙහි පිහිටියාහුයි එහෙයින් තිලබීජයක් පමණ ආ
හාරයකුදු ජිහ්වාග්‍රයෙහි තබනලද්දේ සියලු ශරීර
යෙහි ඕජස් පතුරුවා, උන්වහන්සේ පදන් භූමිය
සාවුරුද්දක් මහාවීර්‍ය්‍යකාරණකල්හි දවසකට එක්
සහලැටයෙකිනුදු කුළුදුලක් පමණවූ සූප්‍යකිනුත්
ශරීරය රක්ෂාකෙළේ එසේ ඕජස් පතුරුවන හෙයි
නි, සෙසු සත්වයන්ගේ ශරීරයෙහි එසේ ඕජස්
නොපැතිරෙණ හෙයින් ඔහු බොහෝ රෝග පීඩා
ඇතිවෙත්, මේ මහාපුරුෂලක්ෂණය අල්පාබාධතා
සංඛ්‍යාත නිස්‍යන්දඵලවශයෙන් ප්‍රකට වේ, මෙසෙයි
න් රසයන්ගේ ග්‍රාසයෙහි අග්‍රවූ රසහරණීන් ඇති
වන බැවින් "රසග්‍රාසාග්‍ර" නම් වෙත්.

"සීහහනු" යන තන්හි ඔවුන් සිංහහනු පරිදි කිසේ
යයත්? බුදුන් සිංහයාගේ හනු සදෘශහනු ඇතිසේකි,
සිංහයාගේ අධස්තාත් හනුවම පරිපූර්ණවේ, උප
රිස්තාත් හනුව අපරිපූර්ණවේ, බුදුන්ටවූකල සිංහ
යාගේ අධස්තාත්හනුව සෙයින් දෙහනුවම පරිපූ
ර්ණවේ, පූරදෙළොස්වක සඳවැනි වේ, මෙසෙයි
න් සිංහයාගේ හනුසදෘශවූ හනු ඇතිවන බැවින්
"සිංහ හනු" නම් වෙත්.

"චත්තාරීසදන්තා" යන තන්හි ඔවුන් චත්වාරිං
ශද්දන්ත පරිදි කිසේයයත්? බුදුන්ගේ උපරිස්තාත්
හනුයෙහි පිහිටි දන්තයෝ විසිදෙනෙක අධස්තාත්
හනුයෙහි පිහිටි දන්තයෝ විසිදෙනෙකැයි මෙසේ
සතලිස් දන්තකෙනෙක් වෙත් සෙසු සත්වයන්ට
දත් සම්පූර්ණවෙනකල දෙතිසක් වේ, බුදුන්ට ස
තළිසෙක් වේ, මෙසේ සතළිසෙක් දන්තයන් ඇති
වනබැවින් "චත්වාරිංශද්දන්තා" නාම වෙත්.

"සමදන්තා" යනතැන්හි ඔවුන් සමදන්ත පරිදි

විශේෂයත්? සෙසු සත්වයන්ගේ ඇතැම් දත් උස් වේ, ඇතම් දත් මිටි වේ, මෙසේ දන්තයෝ විෂමවෙත්, බුදුනටවූකල සපතින් ගිදිනාලද සක්පතක් සෙයින් සමවෙත්, මෙසෙයින් සමවූ දන්තයන් ඇතිවන බැවින් "සමදන්ත" නම් වෙත්.

"අවිවරදන්තා" යන තන්හි අවිවරදන්ත පරිද විශේෂයත්? සෙසු සත්වයන්ගේ දත් කුම්භීරදත් සෙයින් විරලවේ, සිදුරුවේ, මත්ස්‍යමාංසාදිය අනුභව කරණකල දත් අතුරැ පිරෙයි, බුදුනට වූකල පබළු පතක්හ බඳනාලද විදුරැ පෙලක්සෙයින් නොසිදුරැ වේ, තෙල්තුඩින් දක්නාලද පරිච්ඡේදබඳු දන්තයෝ වෙත්, මෙසෙයින් අවිවරවූ දන්තයන් ඇතිවන බැවින් "අවිවරදන්ත" නාම් වෙත්.

"සුසුක්කදාඨෝ,"යන තන්හි ඔවුන් සුශුක්ලදංෂ්ට්‍රා ඇති පරිදි විශේෂයත්? සෙසු සත්වයන්ට පූතිදන්තයෝ නැහොත් එයින් ඔවුන් ඇතම් දංෂ්ට්‍රා කෘෂ්ණවේ, විවර්ණවේ, බුදුනට වූකල දවසත්තාරැ අසිහවා දිලියෙන ප්‍රභාවයෙන් යුක්තවූ සුෂ්ඨුශුක්ලදංෂ්ට්‍රා වේ මෙසෙයින් අර:ධවලවූ දංෂ්ට්‍රා ඇති බැවින් "සුශුක්ලදංෂ්ට්‍ර" නාම් වෙත්.

"පහූතජිව්හා" යන තන්හි ඔවුන් ප්‍රභූතජිහ්වා ඇති පරිදි විශේෂයත්? සෙසු සත්වයන්ගේ දිව් ස්ථූලවේ, කෘෂවේ, ලුහුඬු වේ, බැදිව් වේ, විෂම දිව් වේ, බුදුනට වූකල සොමෙත්‍රාතවූ දික්වූ පලල්වූ වර්ණසම්පන්නවූ දිව් වේ, මෙසෙයින් ත්‍රිලක්ෂණසම්පන්නවූ ජිහ්වා ඇතිවනබැවින් "ප්‍රභූතජිහ්ව" නාම් වෙත්.

"බ්‍රහ්මස්සරෝ කරවීකභාණී" යන තන්හි ඔවුන් බ්‍රහ්මස්වර පරිදි විශේෂයත්? සෙසු සත්වයෝ ඡින්නස්වරයෝ වෙත්, භින්නස්වරයෝ වෙත්, කාකස්වරයෝ වෙත්, බුදුහු වූකල මහාබ්‍රහ්මයාගේ ස්වර සදෘශ ස්වරයෙන් යුක්තවන සේක්, බ්‍රහ්මයාගේ ස්වර

පිත්තශ්ලෙෂ්මාදීන් අපරිශුද්ධ වනබැවින් විශුද්ධ වේ, බුදුන් විසින් කරණලද දානශීලාදී කුශලකර්මය බුදුන්ගේ වස්තු සෝදයි, ඒ සඳහු ශුද්ධ වන බැවින් නාභිය පටන් ගෙණ පහළවන ස්වරය විශුද්ධ අෂ්ටාඞ්ගසමන්නාගතව පහළ වේ, කුරවීකෙවිල්ලන් හඬසෙයින් මධුර වේ, ඒ කුරවීකෙවිල්ලන් රසඇති විළිකුන් අමු එල තුඩින් පැහැර පළාපියා එයින් වැගෙන අඹරස බී පක්ෂතාලදී කූල්නාකාල්හි චතුෂ්පාදාදීහු මධුමද මූදිතයන්සෙයින් ලලිතාරම්භ කෙරෙත්, කෙසේද ? ගොචරයෙහි විචරනවූ චතුෂ්පාදයෝ මුඛයෙන් ගත් තෘණකබල හෙලාපියා සිට ඒහඬ අසත්, සිංහව්‍යාඝ්‍රාදි චණ්ඩමෘගයෝ ක්ෂුද්‍රමෘගයන් ලුහුබඳනාහු ඔසවාගත් පා බහා නොතබා සිට අසත්, ක්ෂුද්‍රමෘගයෝ මරණභය හැරසිට අසත්, අහසින් යන පක්ෂීහු පක්ෂප්‍රසාරණ නොකොට සිට අසත්, දියෙහි මත්ස්‍යසෝදකාණ්ණ පටල නොසොල්වා සිට අසත්, මෙබඳු කුරවීකානාද්ශත භාගයෙන් හෝ සහස්‍රභාගයෙන් හෝ වැඩිමධුර ස්වරයෙන් යුක්තවනසේකි, මෙසෙයින් බුදුහු මහාබ්‍රහ්මයාගේ ස්වරසදෘශ ස්වර ඇතිවන බැවින් ‘ බ්‍රහ්මස්වර ”නම් වෙත්.

“අභිනීලනෙත්‍රා”යනතේහි ඔවුන් අභිනීලනෙත්‍ර පරිදී කිසේය යත්? බුදුන් සියලු නුවනම නිල්වන්නේ නොවේ, නිල්වූමනා තැන්හි දියබෙරලියමල් වැනි ඉතා පිරිසිදු නිල්පැහැය වේ, රත්වන වූවමනා තැන්හි කිනිහිරි මල්වැනි ඉතා රත්වන් පැහැ වේ, රත්වන් වූවමනා තැන්හි බඳුවදමල්වැනි ඉතා රත් පැහැය වේ, සුදු වූවමනා තැන්හි දවහතතාරුවැනි ඉතා සුදුපැහැය වේ, කළු වූවමනා තැන්හි රුක්පෙණෙල ඇටවැනි ඉතා පිරිසිදු කළුපැහැය වේ, මෙසේ නෙත්‍රයුගමයන් රන්පිම්බෙහෙහි නැගූ මිණිසිකිමැදුරක් සෙයින් වැටහෙත්, මෙසෙයින් අභිනීලවූ නෙත්‍රයන් ඇතිවනබැවින් “අභිනීලනෙත්‍ර” නම් වෙත්.

“ගොපඛුමො”යන තන්හි ඔවුන් ගොපක්‍ෂම ඇති පරිදි කිසේද යත්? මෙහි “පක්‍ෂම” නම් සියලු ඇස්ගුල යයි, ඇස්ගුලය කළුවස්සහට ඝනස්වභාව වේ, රතුවස්සහට විප්‍රසන්න වේ, එබැවින් බුදුනට එවිගස උපන් රතුවස්සක්හුගේ අක්‍ෂිගුලය සදෘශවූ අක්‍ෂිගුලයෝ වෙත්, සෙසු සත්වයන්ගේ අක්‍ෂිගුලයෝ අපරිපූර්ණ වෙත්, හස්ති මූසික කාකාදීන්ගේ ඇස් වැනි නිශ්ශ්‍රිතවූ ගම්භීරවූ අක්‍ෂිගුලයෝ වෙත්, බුදුනට වූකලි දෙව මැද තුබූ මණීගුළිකාසෙයින් මොළොක් සිනිඳු නිල් සිදුම් අක්‍ෂිගුලයෝ වෙත්, මෙසෙයින් එවිගස උපන් රතුවස්සක්හුගේ අක්‍ෂිගුල සදෘශවූ අක්‍ෂිගුල ඇතිවනබැවින් “ගොපක්‍ෂම” නම් වෙත්.

“උණ්ණා භමුකන්තරෙ ජාතා” යනාදි තන්හි “ඌර්ණ” නම් කවරයත්? ඒ රෝමය බුදුන්ගේ නලල් මැද වූයේයි, ඉතා පිරිසිදුයි, දුවහතතාරකාවැනි, පහන්ගිතෙල ගලාතුබූ සියක්විට පෙළ පුලුන් පෙදක් සෙයින් මොළොකි, සිඹුල්පුලුන් ලියපුලුන්හා සමානයි, ඒ රෝමය කෙළවර ගෙණ ඇදිකල්හි අඩ්බාහුප්‍රමාණ වේ, හැරිකල්හි දක්‍ෂිණාවර්තනවශයෙන් කැරකැවී ඌර්ධ්වාග්‍රව සිටී, රන්පුවරුවක් මැද තුබූ රිදීබුබුලක් මෙන්ද රන්කලසකින් නික්මෙණ ක්‍ෂීරධාරාවක් මෙන්ද අරුණුවන් රස්මියෙන් රැඳී ගිය නභස්තලයෙහි ඖෂධිතාරකාවක් මෙන්ද ඉතා සිත්කලුව දිලියේ, මෙය “ඌර්ණරෝම” නම් වේ.

“උණ්හිසසීසො”යන තන්හි ඔවුන් උෂ්ණීෂශීර්ෂ පරිදි කිසේද යත්? ගේ සම්පූර්ණ ලලාට ඇතිවන බවද සම්පූර්ණ ශීර්ෂ ඇතිවනබවද ගෙණ කියත්, බුදුන්ගේ දක්‍ෂිණකර්ණචූලිකාවෙහි පටන් ගෙණ මාංසපටලයෙක් නැඟී සියලු නලල වසා පුරා ගොස් වාමකර්ණචූලිකාවෙහි සිටියේයි, රජක්හුගේ නලලෙහි බඳනාලද රන්පටක්සෙයින් දිලියේ, පශ්චිම

භාවිතවූ බෝධිසත්වයන්ගේ මේ ලක්ෂණය දැක රජදරුවන්ට උෂ්ණීෂපට්ට කළාහුයි, (නළල්පට කළාහුයි,) මේ එක් අර්ථයෙකි, සෙසු සත්වයෝ අපරිපූර්ණ වූ ශීර්ෂ ඇති වෙත්, ඇතම් කෙනෙක් කපිශීර්ෂ වෙත්, ඇතම් කෙනෙක් ඵලශීර්ෂ වෙත්, ඇතම් කෙනෙක් හස්තිශීර්ෂ වෙත්, ඇතම් කෙනෙක් කුම්භශීර්ෂ වෙත්, ඇතම් කෙනෙක් ප්‍රාග්භාරශීර්ෂ වෙත්, බුදුනට වූකල හිඳිඅගින් වටා තුබූ මාංසසෙයින් පරිපූර්ණ වූ දියබුබුලක්බඳු ශීර්ෂ වේ. එහි ප්‍රථම පක්ෂයෙහි උෂ්ණීෂපට්ටයෙන් වෙළනලද හිසක් වැනිහෙයින් “උෂ්ණීෂශීර්ෂ” වේ, විතිය පක්ෂයෙහි උෂ්ණීෂපට්ටයක් සෙයින් හැමතන්හි පරිමණ්ඩලශීර්ෂ “උෂ්ණීෂශීර්ෂ” නම් වේ, මෙසෙයින් උෂ්ණීෂ සදෘශ ශීර්ෂ ඇතිවනබැවින් “උෂ්ණීෂශීර්ෂ” නම් වෙත්, බුදුහු.

මෙබඳු ද්වාත්‍රිංශත් මහාපුරුෂලක්ෂණයන්ගේ ශොභායෙන් බුදුහු මණිගණප්‍රභාසමුජ්ජ්වලිත රත්නාකරයක්හුගේ ශ්‍රීවිභූති අබිබවමින් දිලියෙන සේකි.

“මණිගණපභාසමුජ්ජලතලස්ස රතනාකරස්ස
සිරිවිභවන්තං
භගවන්තමභිභවන්තං ච ද්වත්තිංසවිමලලක්ඛ
ණසිරියා”යි

යනු එහෙයින්ම කියනලදී-මේ “ද්වාත්‍රිංශත් මහාපුරුෂලක්ෂණ” නම් වේ.

මොහු කවරකාරණයෙකින් ලක්ෂණ නම් වූවාහු දයත්? මේ දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන් සැදුම් ලද බුදුන්ගේ ශරීරසමෘද්ධිය දුටු ලක්ෂණඥ දිගම්බරපරිව්‍රාජික බ්‍රාහ්මණ මානවකාදීන් විසින් “මොහු එකාන්තයෙන් සවුනේ ගෙවා දත් බුදුහුමය”යි මේ ලක්ෂණවශයෙන් දත්නාබැවින් “ලක්ෂණ” නම් වෙත්- “ලක්ඛ දස්සනාඞ්කෙසු”යන ධාතුයි- මෙතැන්හි ලක්ෂණ ශබ්දය චිහ්නයෙහි වැටේ-“චිහ්න”නම්, සලකුණයි.

"අසූවක් අනුව්‍යඤ්ජන" නම් කවරහු යත්? "චිතඞ්ගුලිතා, අනුපුබ්බඞ්ගුලිතා-වට්ටඞ්ගුලිතා-තම්බනඛතා - තුඞ්ගනඛතා-සිනිද්ධනඛතා-නිගූළ්හගොප්ඵකතා-සමපාදතා-ගජසමානක්කමතා-සීහසමානක්කමතා-හංසසමානක්කමතා - උසභසමානක්කමතා - දක්ඛිණාවත්තගතිතා-සමන්තතොචාරුජණ්ණුමණ්ඩලතා-පරිපුණ්ණපුරිසබ්‍යඤ්ජනතා - අච්ඡිද්දනාභිතා -ගම්භීරනාභිතා-දක්ඛිණාවත්තනාභිතා - ඒරාවණකරසදිස ඌරුභුජතා -සුවිභත්තගත්තතා-අනුපුබ්බගත්තතා-මට්ඨගත්තතා - අනුස්සන්නානුස්සන්නසබ්බගත්තතා-අලීනගත්තතා -තිලකාදිරහිතගත්තතා- අනුපුබ්බරුචිරගත්තතා- විසුද්ධගත්තතා-කොටිසහස්සහත්ථිබලධාරණතා-තුඞ්ගනාසතා-සුරත්තද්විජමංසතා- සුද්ධදන්තතා සිනිද්ධදන්තතා-විසුද්ධින්ද්‍රියතා-වට්ටදාඨතා- රත්තොට්ඨතා - ආයතවදනතා- ගම්භීරපාණිලෙඛතා - ආයතලෙඛතා-උජ්ජුකලෙඛතා-සුරුචිරසණ්ඨානලෙඛතා-පරිමණ්ඩලකායප්පභාවන්තතා - පරිපුණ්ණකපොලතා - ආයතවිසාලනෙත්තතා - පඤ්චපසාදවන්තනෙත්තතා - ආකුඤ්චිතග්ගපඛුමතා- මුදුතනුකරත්තජිව්හතා-ආයතරුචිරකණ්ණතා - නිග්ගණ්ඨිසිරතා - නිග්ගූළ්හසිරතා-ඡත්තනිභචාරුසීසතා-ආයතපුථුලලලාටසොභතා-සුසණ්ඨානභමුකතා-සණ්හභමුකතා-අනුලොමභමුකතා- මහන්තභමුකතා - ආයතභමුකතා-සුකුමාලගත්තතා-අතිවියසොම්මගත්තතා - අතිවිය උජ්ජලිතගත්තතා- විමලගත්තතා - කොමලගත්තතා- සිනිද්ධගත්තතා - සුගන්ධතනුතා - සමලොමතා-කොමලලොමතා- දක්ඛිණාවත්තලොමතා - භින්නඤ්ජනසදිසනීලලොමතා-සිනිද්ධලොමතා- අතිසුඛුමඅස්සාසපස්සාසධාරණතා-සුගන්ධමුඛතා- සුගන්ධමුද්ධනතා-සුනීලකෙසතා-දක්ඛිණාවත්තකෙසතා-සුසණ්ඨානකෙසතා - සිනිද්ධකෙසතා - සණ්හකෙස

තා-අලුලිතකෙසතා-පම්කෙසතා-කොමළකෙසතා-කෙතුමාලාරතනරඤ්ජිතතා"යි-බුදුනු මෙබඳු අශීතිඅනුව්‍යඤ්ජනයෙන් බබලන විචිත්‍ර ලක්‍ෂණ සම්පත් හා ප්‍රජ්වලිත කෙතුමාලා ජාලයෙන් සමුජ්වලිතරූප ශොභාඇති සේක-

"තමසීතිඅනුව්‍යඤ්ජන-
සමනුබ්‍යඤ්ජන විචිත්‍රලක්ඛණවිභවං
පජ්ජලිතකෙතුමාලා-
ජාලසමුජ්ජලිතරූපසොභං වන්දෙ"-යි

යනු එහෙයින්ම කියනලදි-මේ "අශීතිඅනුව්‍යඤ්ජන නාම්" වේ.

මොහු කවරකාරණයකින් "අනුව්‍යඤ්ජන"නම් වූදයත්? මේ අශීතිඅනුව්‍යඤ්ජනයෝ දෙතිස් මහාපුරුෂලක්‍ෂණ අනුව ගොස් ලක්‍ෂණප්‍රකාශ හා ශරීරශොභාව මොනවට ප්‍රකාශකරණහෙයින් අනුව්‍යඤ්ජන නම් වෙත්-අනු වි පූර්වවූ "අඤ්ජ බ්‍යත්තිගතිමක්ඛණකන්තිසු" යන ධාතුයි-මේ දෙතිස් මහාපුරුෂලක්‍ෂණහා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් ශුභනහෙයිනුත් "සුගත" නම් වනසේක.

තවද විපුලවිමලකරුණාසමෘතිවීය්‍ය්‍යාදි ගුණවිශෙෂ සහිතවූ ඥාණගමනයෙන් ශුභනහෙයිනුත් "සුගත" නම් වනසේක.

"ලොකවිදූ"යන තන්හි සංස්කාරලොකය අවකාශලොකය සත්වලොකයයි ත්‍රිවිධ වේ, එහි "එකො ලොකො සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා, ද්වෙ ලොකා නාමඤ්ච රූපඤ්ච, තයො ලොකා තිස්සො වෙදනා, චත්තාරො ලොකා චත්තාරො ආහාරා, පඤ්ච ලොකා පඤ්චුපාදානක්ඛන්ධා, ඡ ලොකා ඡ අජ්ඣත්තිකානි ආයතනානි, සත්ත ලොකා සත්ත විඤ්ඤාණට්ඨිතියො, අට්ඨ ලොකා අට්ඨ ලොකධම්මා, නව ලොකා නව සත්තාවාසා, දසලොකා දසායතනානි, ද්වාදස ලොකා ද්වාදසායතන

නාති, අට්ඨාරස ලොකා අට්ඨාරස ධාතුයො" යි කියනලද සත්ත්වාවකාශලොකයෙහි ප්‍රත්‍යයොත්පන්නවූ ඉන්ද්‍රියාන්ද්‍රියප්‍රතිබද්ධස්කන්ධයෝ අවිද්‍යාදිප්‍රත්‍යයන් විසින් සංස්කාරණය කරණලදහෙයින් "සංස්කාර" නමුත් වෙත්, ජරාවෙන් අවස්ථාන්තරප්‍රාප්තින් යොවූත් නැසිමය යන ලුජ්ජනාර්ථයෙන්ද මරණින් ජීවිතෙන්ද්‍රියොපච්ඡෙද යයි කියනලද පලුජ්ජනාර්ථයෙන්ද "ලොක" නමුත් වේ-ලුජ්ජති පලුජ්ජතීති ලොකො- "ලුජ විනාසෙ" යන ධාතුයි- "සබ්බෙසම්පි සත්තානං ආසයං ජානාති අනුසයං ජානාති චරිතං ජානාති අධිමුත්තිං ජානාති අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ" යි කියනලද ඉන්ද්‍රියප්‍රතිබද්ධස්කන්ධයන්ගේ සමූහසන්තාන දෙක රූපාදිආරම්මණයෙහි සක්තව පවත්නාහෙයින් "සත්ත්ව" නමුත් වේ, අනුමාණවශයෙන් කුශලාකුශලයද ප්‍රත්‍යක්ෂවශයෙන් එහි ඉෂ්ටානිෂ්ටවිපාකයද මෙහි සිට බලනහෙයින් 'ලොක' නමුත් වේ-ලොකයන්ති එත්ථ සුභාසුභං තංඵලඤ්චාති ලොකො- "ලොක ලොචන දස්සනෙ" යන ධාතුයි- "යාවතා චන්දිමසූරියා පරිහරන්ති දිසා භන්ති විරොචනා" යනාදින් දක්වන අයමින් විතරින් දොලොස් ලක්ෂ තුන්දහස් සාරසිය පණස්යොදුන් පමණඇති වටින් සතිස්ලක්ෂ දශදහස් තුන්සිය පණස්යොදුන් පමණඇති චක්‍රවාළය, දෙලක්ෂ සතළිස්දහස් යොදුන් පමණ බොලඇති මහත් පස්පොළොවය, ඒපස් පොළොව දූරූ සාරලක්ෂ අසූදහසක් යොදුන් පමණ බොලඇති දියපොළොවය, ඒ දියපොළොව දූරූ නවලක්ෂ සැටදහසක් යොදුන් පමණ බොලඇති වාපොළොවය, මෙසේ සිටි මේ ලොව සූවාසූදහසක් යොදුන් පමණ සාගරයෙහි ගැලිසිටි සූවාසූදහසක් පමණ නැගී සිටි මහාමෙරුපර්වතය, ඒ මහමෙරට අර්ධාර්ධප්‍රමාණයෙන් සමුද්‍රයෙහි ගැලී නැගී සිටි

දෙවයක්ෂවාසනානාවිධරතනයෙන් විචිත්‍රවූ යුගන්ධර
ඊෂධර කරවීක සුදර්ශන නෙමින්ධර විනතකාදි සප්ත කු
ලපර්වතයෝය, පන්සියයක් යොදුන් පමණ උස ඇති
අයම් විත්ථාරින් තුන් තුන් දහසක් යොදුන් පමණ
ඇති සුදර්ශන චිත්‍රකූට කෛලාසකූට යනාදි සුවාසූද
හසක් කූටයෙන් ප්‍රතිමණ්ඩිත හිමාලයපර්වතය, මෙම
දඹදිවට සලකුණුවූ මලසිට වෙලප පණස් යොදුන
ක් පමණඇති එසේම පණස් පණස් යොදුන් පමණ
වූ පංච මහාශාඛාවන් ඇති සියක් යොදුන් පමණ වි
ස්තාරොද්වේධ ඇති සියාරා තුන්සියයක් යොදුන් පම
ණඇති මහාජම්බුවෘක්ෂය. දෙයසූදහසක් යොදුන් ප
මණ සාගරයෙහි ගැලී සිටි දෙයසූදහසක් යොදුන්
පමණ නැඟී සිටි සක්වලනලය, අයම්විත්ථාරින් උසි
න් එකුන්පණස් යොදුන් සඳමඩලය, පමපණස් යො
දුන් හිරුමඩලය, දශදහසක් යොදුන් පමණ ඇති
ශක්දෙවරජහට නිවාසවූ තව්තිසාභවනය, එසේ
දශදහසක් යොදුන් පමණ ඇති අසුරභවනයහා
අවීචිමහානරකයහා ජම්බුද්වීපය, සද්දහසක් යොදුන්
පමණඇති අපරගොයානයහා පූර්වවිදෙහය, අටද
හසක්යොදුන් පමණඇති උතුරුකුරුදිවයිනය යන
ක්ෂුද්‍රද්වීප පන්සියයක් පන්සියයක් පිරිවරකොටඇති
සතරමහාද්වීපය, යනාදිවශයෙන් අනන්තාපරිමාණ
ලොකධාතු යයි කියනලද අනින්ද්‍රියප්‍රතිබද්ධරූපයන්
ගේ සමූහසන්තාන දෙක ජඞ්ගමස්ථාවරවස්තු එහි
පෙණෙනබැවින් "ලොක" නමුත් වේ, උන්ට අව
කාශවූ හෙයින් "අවකාශ" නමුත් වේ.

බුදුනු මේ යථොක්තවූ ලොකත්‍රය ක්‍රමයෙන් ස්වල
ක්ෂණසාමාන්‍යලක්ෂණයෙන් කුශලාකුශලාදීන් හෙ
තවාදීත්ද ආශයානුශයචරිතාධිමුක්තික අල්පරජස්කම
හාරජස්කාදි වශයෙන්ද ප්‍රමාණසංස්ථානාදිප්‍රභෙදයෙන්
ද සර්වප්‍රකාරයෙන් අවබොධ කළසේක්, එහෙයින්

“සබ්බථා විදිතලොකත්තා ලොකවිදූ” යනමේ අර්ථයෙන් “ලොකවිදූ” නම් වනසේක- “ලොකං විදතීති ලොකවිදූ” විග්‍රහ විතියාතත්පුරුෂයි- ලොක යන විත්‍යාහොතාං පපදවූ “විද ඤාණෙ” යන ධාතුනුකෙරෙන් කෘත් විධික්‍රමයෙන් සිධයි.

“අනුත්තරෙ” යනතන්හි ශීලසමාධිප්‍රඥාවිමුක්තිවිමුක්තිඥානදර්ශනාදිවූ ගුණවිශෙෂයෙන් ආත්මසදෘශාධික පුද්ගලාන්තරයක්හු නැති බැවින් “නත්ථි උත්තරො එතස්ස” යන වාක්‍යයෙහි නඤ්සමාසගර්භකොටඇති බහුබ්‍රීහිසමාසවශයෙන් බුදුහු “අනුත්තර” නම් වනසේක.

“පුරිසදම්මසාරථි” යන තන්හි දම්‍යහයි කියනලද අපලාලනාගරාජ චූලොදර මහොදර අග්නිශිඛ ධූමශිඛ බනපාලාදිවූ තිරශ්චීනපුරුෂයන්ද, සත්‍යක නිග්‍රන්ථපුත්‍ර අම්බට්ඨමානවක පුෂ්කරසාති ශොණදණ්ඩ කූටදන්ත ඝොටමුඛ උපාලිගෘහපති ආදිවූ මනුෂ්‍යපුරුෂයන්ද, ආලවක සූචිලොම ඛරලොමයක්ෂ ශක්‍රදෙවරාජ බකබ්‍රහ්මාදිවූ අමනුෂ්‍යපුරුෂයන්ද යන කායවාක් සමථාදියෙහි යෙදියයුතුවූ පුරුෂයන් සුදුසු සුදුසු පරිද්දෙන් තදඞ්ගවිනයාදියෙහි පිහිටුවනහෙයින් “පුරිසදම්මෙ සාරෙතීති පුරිසදම්මසාරථි” යන තත්පුරුෂසමාසයෙන්හා කෘත්විධික්‍රමයෙන් බුදුහු “පුරුෂදම්‍යසාරථි” නම් වනසේක.

නොහොත් “අනුත්තරො පුරිසදම්මසාරථි” යනු එකම අර්ථපදයෙකි, මෙයින් බුදුන්ගේ අනන්‍යසාධාරණවූ පුරුෂදම්‍යසාරථි භාවය දක්වනලදී, කෙසේද? මේ ලොකයෙහි හස්තිදමක අශ්වදමකාදීන් විසින් දමනලද හික්මවනලද හස්ත්‍යශ්වාදීහු පෞරස්ත්‍යාදි අටදිගුන් අතුරෙන් එකවරෙක එකදිශාවකටම දිවෙත්, බුදුන් විසින් දමිත පුරුෂදම්‍යයෝ වනාහි නිෂද්‍යාසංඛ්‍යාතවූ එකම ඊර්ය්‍යාපථයෙකින් නිදශීනමාත්‍ර

වූ රූපාරූප අෂ්ටසමාපත්ති නැමති අවදිගට්ද ලෞකි කපෘථග්ජනයන් විසින් ස්ව්ප්නයෙකුදු අනනුභූතපූර්වවූ නිරොධසමාපත්ති යයි කියනලද නිවන් නැමැති දිග ට්ද භාවනයකෙරෙත්, එහෙයින් "අනුත්තරො ච සො පුරිසදම්මසාරථී චෙති=අනුත්තරොපුරිසදම්මසාරථි" යනකර්මධාරයසමාසවශයෙන් බුදුනු "අනුත්තරපුරුෂද ම්‍යසාරථි" නම් වනසේක්-"මාතාපිතූනං හදයං පූ රෙන්තීති පුරිසා" 'පූරෙ හාපාමා කිසො රසො සො ච'* ය න ණ්වාදිසූත්‍රයෙන්, 'පූර පූරණෙ' යන ධාතුකෙරෙ න් විහිත කිසප්‍රත්‍යයෙන්හා ධාතු ඌකාරයහට හ්‍ර ස්වකිරීමෙන් පුරිසශබ්දසිද්ධ දතයුතු-"දම්තබ්බා දම්මා, දම දමනෙ" යන ධාතුකෙරෙන් ව්‍යාත්කෘදන්ත ප්‍රත්‍යයෙන් සිඬයි-පුරිසා ච තෙ දම්මා චෙති=පුරිසද ම්මා-"සාරෙන්තීති සාරථි" සාරෙතිත්, පදිනුයි;(පවත්වා නුයි; )සාරථි, සාරථි නම් වේ-"සාරිසුමාරථි"*යන ණ වාදිසූත්‍රයෙන් "සර ගතිහිංසාචිනානාසු" යන ධාතු හුකෙරෙන් විහිත රථිප්‍රත්‍යයෙන් සාරථිශබ්ද සිද්ධය ද තයුතු-"පුරිසදම්මෙ සාරෙතීති පුරිසදම්මසාරථි" පුරි සදම්ම, දමියයුතු මනුෂ්‍යාමනුෂ්‍යතිර්යග්ජාතිපුරුෂයන් සාරෙතිති, දමානුයි හික්මවානුයි ; පුරිසදම්මසාරථි, පුරිසදම්මසාරථි නම් වේ-දමියයුතු සත්‍ව්‍යන් ඇතද උ තතමවශයෙන් "පුරුෂදම්‍යසාරථි" යි කීහු.

එක්සමයෙක්හි කෙශිය† නම් අශ්වදම්‍යසාරථි යෙක් බුදුන්කරා එළඹ නමස්කාර කොට එකත්ප ස්ව හුනි, එකල්හි බුදුනු ඔහුට "කෙශිය තෝ ප්‍රසිද්ධ අශ්වදම්‍යසාරථි යෙහිය, එබඳු තෝ අශ්වයන් කෙසෙතක් ප්‍රකාරයෙකින් විනයනය කෙරෙහිදැ"යි විචාරාවදාළ සේක්, "ස්වාමිනි සර්වඥයන්වහන්ස මම් අශ්වයන්සල ක්ෂණයෙනුදු විනයනය කෙරෙම් පරුෂයෙනුදු විනයනය කෙරෙම් සලක්ෂණපරුෂයෙනුදු විනයනය

*මේ කපුප් මුගලන් ව්‍යාකරණයන්හි අදුගැසි-එබැවින් සෙවියයුතුයි

+ [illegible] "කෙශිය" [illegible]

කෙරෙමි"යි දැන්වී "කෙශිය මේ තුන්ප්‍රකාරයෙන් නොහික්මෙන අශ්වයන්ට නෝ කුමක් කෙරෙහිද"යි විචාළසේක්, "ස්වාමීනි බුදුරජානන්වහන්සෙ මාගේ ආචාර්ය්කුලයට අකීර්ති නොවනු සඳහා ඔවුන් මරමි"යි දැන්වී, මෙසේ දන්වා ඉක්බිති "වහන්ස නුඹවහන්සේත් අනුත්තරපුරුෂදම්‍යසාරථී වන සේක, එබඳු නුඹවහන්සේ සත්ත්වයන් කොතෙක් ප්‍රකාරයෙකින් විනයනය කරවාද"යි විචාළේය; බුදුහු එවිට ඔහට "කෙශිය මම සත්ත්වයන් සලක්ෂ්ණයෙනුත් විනයනය කෙරෙමි පරුෂයෙනුත් විනයනය කෙරෙමි සලක්ෂණ පරුෂයෙනුත් විනයනය කෙරෙමි"යි වදාළසේකි:-"එහි 'සලක්ෂණ' නම්? සුචරිත මෙසේය, සුචරිතඵල මෙසේය, ස්වර්ගලොක මෙසේය යන මෘදුදෙශනායි. 'පරුෂ'නම්? දුශ්චරිත මෙසේය දුශ්චරිතඵල මෙසේය අපායලොකමෙසේයයන කර්කශදෙශනායි."සලක්ෂණපරුෂ"නම්? මේදෙකින්ව්‍යතිමිශ්‍රදෙශනායි"-:එකල්හි ඒ කෙශියනම් අස්දම්සැරියතෙමේ 'මේතුන්ප්‍රකාරයෙන් විනයනය නොවන සත්ත්වයන්ට කුමක්කරණවාද"යිවිචාළේය 'කෙශිය ඔවුන් මරමි'යිවදාළසේකි. එවිට "තමන්වහන්සේට ප්‍රාණවධ නුසුදුසුවේද"යි කී "කෙශිය ඒ සැබැව මට ප්‍රාණවධ නුසුදුසුය එහෙයින් "මරමි"යි මා කීවචනය අනිකෙක වචනාව අනිකෙක යමෙක් සරාගසද්වෂ:දිශොධශාකාරයෙන් ආශයානුශයාදිය බැලූකල මේ තුණින් එකතරා ප්‍රකාරයෙකිනුත් විනයනය නොවේ නම් නොහික්මේ නම් හේ මාවිසින් අනුශාසනා කටයුතු නොවෙයි, ඒ ඕහට වධවෙ' යි වදාළසේකි, මේ කාරණයෙනුත් බුදුහු "අනුත්තරපුරුෂදම්‍යසාරථි" නම් වනසේකි.

"සත්ථා දෙවමනුස්සානං"යන තන්හි "දිට්ඨධම්මිකසම්පරායිකපරමත්ථේහි යථාරහං අනුසාසතීති සත්ථා"යනනුහෙයින් බුදුහු උත්කෘෂ්ටසත්ත්වභව්‍යපුද්ගලපරිච්ඡේද

වශයෙන් දිව්‍යමනුෂ්‍යයන්ට ඓහිකාමුෂ්මිකපරම පුරුෂාර්ථය යන මෙයින් හෙවත් මෙලොව් පරලොව් හිතයෙන්ද නිර්වාණයෙන්ද සුදුසු සුදුසු පරිදෙන් අනුශාසනා කරණහෙයින් 'ශාස්තෘ' නම්වනසේකි මෙහි "අනුශාසනා" නම්, ඒ ඒ අර්ථයෙහි ඒ ඒ වැඩෙහි පිහිටු වීමයි, නොහොත් "සත්ථවාහොති සත්ථා' යනමේ අර්ථයෙන්ද බුදුහු ජඞ්ඝසාර්ථකටසාර්ථනායකයා වැනි හෙයිනුත් නෛරුක්තිකවිධියෙන් 'ශාස්තෘ" නම්වනසේකි. යම්සේ ජඞ්ඝසාර්ථකටසාර්ථනායකයෙම සත්ව මූල චොරකාන්තාරය ව්‍යාලකාන්තාරය අමනුෂ්‍යකාන්තාරය නිරුදකකාන්තාරය අල්පභක්ෂ්‍යකාන්තාරය යන මේ පඤ්චප්‍රකාර කාන්තාරයෙන් අතික්‍රමණය කොට නිරුපද්‍රවස්ථානයට පමුණුවාද එපරිදෙන් බුදුහු සත්වයන් ජාතිජරාමරණ නැමැති මහකතරින් එතර කොට නිවන් නැමති ශාන්තිපුරයට පමුණුවනාසේකි.

"දෙවමනුස්සානං" යන මේ පදය උත්තමසත්වපරිච්ඡේදවශයෙන්ද මාර්ගාධිගමයට යොග්‍යපුද්ගලපරිච්ඡේදවශයෙන්ද කියනලදී. එහෙයින් බුදුහු තිරශ්චීනයන්ටත් අනුශාසනා කිරීමෙන් "ශාස්තෘ" වනසේකි. ඒ තිරශ්චීනයෝත් බුදුන් අතින් බණ ඇසීමෙන් ත්‍රිහේතුකප්‍රතිසන්ධි ආදිවූ මාර්ගඵලාධිගමයට බලකාරණලදින් දෙවැනි තුන්වැනි ආත්මභාවයෙහි මාර්ගඵලයට හිමි වෙත්. ඒ මෙසේ මැයි.

එක්සමයෙක්හි අපබුදුන්"ගග්ගරා"නම් රාජමහෙසිකාවවිසින් ඛණිනය කරවූහෙයින් "ගග්ගරා" නම්වූ පුෂ්කරණීතීරයෙහි ප්‍රඥප්තාසනයෙහි වැඩහිඳ චම්පානුවරවාසීන්ට ධර්මදෙශනා කරණකල්හි එහි වසන එක් මණ්ඩූකයෙක් බුදුන්ගේ ශබ්දයෙහි "මේ කියන්නේ බණකෑ"යි ධර්මසංඥයෙන් ප්‍රසන්නචිත්තයෙන් නිමිත්තග්‍රහණය කළේය, මෙහි "නිමිත්තග්‍රහණය"

නම්? මෙනතයි ලැබියයුතු ලෞකිකලොකොත්තර
සම්පත්තියට කාරණවූ බුද්ධවචනශ්‍රවණයයි. එකල්
හි එක්වස්සත් රකිණ ගොපල්ලෙක් එතැන්හි දණ්ඩ
ක එල්බ සිටිනේ ඒ මණ්ඩුකයාගේ ඉස ඔබා ගෙණ සි
ටියේය, එකල්හි ඒ මණ්ඩුකයා ඒදුඃඛයෙන් එවිටම
කාලක්‍රියා කොට තුන්කෙලසැටලක්‍ෂයකට ආයුඇති
තව්තිසා දිව්‍යලොකයෙහි නිදා පිබිදියක්හු මෙන් දෙ
ලොස් යොදුන පමණ ඌන ඇති රන්විමණෙක ඔපපා
තිකව උපනී, එසෙම එහි දහස්ගණන් දෙවගණන්ව
සින් පිරිවරණලද තමා බලා "කොල මමත් මෙසේවූ
තැනක උපන්මිට නෙතු කවරනම් කුශලකර්මයක්
කෙලෙම්"දො හෝයි ආභොග කරන්නේ (දිවසින් ප
රීක්‍ෂාකොට බලන්නේ) බුදුවදන්හි කල නිමිත්තාග්‍රහ
ණය විනා අන් (වෙනින්) කල කුශලයක් නුදුටි, ඒ දි
ව්‍යපුත්‍රතෙම එවිගසම දිව්‍යාප්සරාසමූහයාවිසින් පිරිව
රණලදුව දොළොස්යොදුන් රනවිමණහා සමග බුදු
න්කරා එලඹ ශ්‍රීපාදය නමස්කාර කෙළේය, එකල්හි
බුදුහු ඔහු දනවදූරනසේක් ම එතැන්හි රැස්වූ පිර්
ද්ට ධර්මශ්‍රවණමයකුශලයෙන් ජනිත ඉෂ්ටවිපාකය
ඔහුලවාම ප්‍රකාශකරවනුපිණිස

"කො මෙ වන්දති පාදානි ඉද්ධියා යසසා ජලං
අභික්කන්තෙන වණ්ණෙන සබ්බා ඔභාසයං දිසා"-යි

යන මේ ගාථාවෙන් "දෙවසෘද්ධියෙන්ද දිව්‍යඓශ්වර්‍ය
යසයෙන්ද එකොභාස එකාලොකකොට දිලියෙමි
න් ඉතාසහපත්වූ ශරීරවර්‍ණයෙන් සියලු පෞර
ස්ත්‍යාදි දසදිගුන් හිරුසේ සඳසේ එකොභාස එකා
ලොක කෙරෙමින් අවුත් මාගේ පාදයන් කවරෙක්
වඳනේදැ"යි වදාළසේක්-හෙතෙම එවිට

"මණ්ඩුකොහං පුරෙ ආසිං උදකෙ වාරිගොචරො
තව ධම්මං සුනන්තස්ස අවධි වච්ඡපාලකො"-යි

යන මේගාථාවෙන් "දියෙහි දියම ගොදුරුකොට

ඇති පෙර මම මණ්ඩූකයෙක් වීමි, ස්වාමීනි බුදුරජාන
න්වහන්සේ නුඹවහන්සේගේ මේ බණ අසන මා එක්
වස්සපාලෙක් දණ්ඩකින් මැඩ මැරුයේය"යි දූත්
වී, බුදුහු එවිට ඕහට ධර්මදෙශනා කොටවදාළසේක්,
ඒ ධර්මදෙශනාවෙන් එතැන්හි රැස්වූ සුවාසූදහසක්
ප්‍රාණීන්ට චතුස්සත්‍යප්‍රතිවෙධය වී, (මාර්ගඵලාධිගම
ය වී,) ඒ මණ්ඩූකදිව්‍යපුත්‍රද දහසක් නඩිත් ප්‍රතිමණ්ඩි
තවූ සොවාන්ඵලයෙහි පිහිටා එසේම ඉතාමදවූ කුශ
ලානුභාවයෙන් මෙසේ ඉතා මහත්වූ ලොව් ලොවු
තුරා සැප ලැබෙත්නේය"යි කියා උපන් ප්‍රීතිසොම්
නසින් ඤනා පහළකොට

"මූහුත්තං චිත්තප්පසාදස්ස ඉද්ධිම්පස්ස යසඤ්ච මෙ
අනුභාවඤ්ච මෙ පස්ස වණ්ණම්පස්ස ජුතිඤ්ච මෙ
යෙ ච තෙ දීඝමද්ධානං ධම්මං අස්සොසුං ගොතම
සම්පත්තා අචලං ඨානං යත්ථ ගන්ත්වා න සොචරෙ"යි

යන මේ ගාථා දෙකින් බුදුන්ට ස්තුතිකොට තමා
ගේ දිව්‍යලොකයටම ගියේය, එසේහෙයින් බුදුහු ති
රශ්චීනයන්ටත් "ශාස්තෘ" වනසේක්, "අනුසාසතීති
සත්ථා" අනුශාසනා කෙරේනුයි හෙවත් ඒ ඒ අර්ථයෙහි
ඒ ඒ වැඩෙහි පිහිටුවානුයි, සත්ථා, ශාස්තෘ නම් වේ, මෙ
හි "අනුශාසනා" නම්? සත්වයන් ඉහලොකපරලොකා
දීන් වන ඒ ඒ වැඩෙහි පිහිට වීමයි, නොහොත් "අ
ත්ථේන සහ වත්තන්ති=සත්ථෝ"-අත්ථේන සහ, අර්ථසං
ඛ්‍යාතවූ ධනයහා සමග; වත්තන්ති, පවතිනුයි; සත්ථෝ,
සාර්ථ නම් වේ. හේ කවරෙක්ද? බඩු ම්ලගෙණ වෙළ
ඳම්පිණිස දෙශාන්තරයට යන වණික්ජනසමූහයි,
මේ තද්ගුණසංවිඥනබහුබ්‍රීහි සමාසයි, 'සො එතස්ස අ
ත්ථීති=සත්ථා'-සො, හිතොපදෙශාදිවශයෙන් රක්ෂා
කටයුතුවූ අනුශාසනාකටයුතුවූ ඒ වෙළඳමුළ, එතස්ස
අත්ථීති, මොහට ඇත්නුයි, සත්ථා, සාර්ථ නම් වේ. හේ
කවරෙක්ද? ජඞ්ඝසාර්ථ සකටසාර්ථනායකයි. මේ අත්‍ය

විතණ්තයි. "සජ්ජා වියානි=සත්වා"-සජ්ජා වියාති,
ජඩ්ඛසාවි ශකටසාවිනාශකයා වැනිහුයි; සත්වා,උපචා
රවශයෙන් බුදුහු "සත්ථු" නම් වනසේකි. "අනත්සඛ
භාවෙනත්සවහාවාරොපණමුපචාරඃ" 'කාංතාරෙතී'
එත්‍යාති=කාන්තාරො'-කාං, ජලය; එත්, මෙනිලා; තා
රෙන්තිති ගෙණ එත්හුයි, කන්තාරෙ, කන්තාර නම්
වේ. හේකාන්රේද ? නිරුදකවූ අරණ්‍යප්‍රදෙශ යයි,
මෙයින් පිටත් සෙසු සජලඅරණ්‍යප්‍රදෙශයෝද රූඪිව
ශයෙන් කාන්තාර යයි කියනුලැබෙත්.

"බුද්ධො"යනතන්හි බුදුහු චතුස්සත්‍යය තමන්වහ
න්සේ ප්‍රතිවෙධ කළ හෙයිනුත් අනුන්ලවා ප්‍රතිවෙධ
කරවූ හෙයිනුත් 'බුධ'නම් වනසේකි, මෙහි "චතුස්ස
ත්‍යය"නම්? දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍ය
ය මාර්ගසත්‍යය යන මේ සතරය්. මොවුන් අතුරෙන්

"ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛං අරියසච්චං ජාතිපි
දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛා මරණම්පි දුක්ඛං අ
ප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො
දුක්ඛො යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං සංඛිත්තෙ
න පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" යනාදීන් දක්වන ලද්
දේ "දුඃඛසත්‍ය" නම් වේ.

තවද චුතියෙන් ප්‍රතිසන්ධියට ගොස් ප්‍රතිසන්ධියෙන්
චුතියට ගොස් ස්වර්ගයෙන් අපාය ගාමීව අවීචියෙහි
පටන් භවාග්‍රය දක්වා භවාග්‍රයෙහි පටන් අවීචිය ද
ක්වා සසර අනන්තාපරියන්තවූ ලොකධාතුයෙහි අවි
ද්‍යාමය නාභිඇති ජරාමරණ නැමති නිම්වළලු ඇති
අවිද්‍යා පූර්වකොට ඇති සංස්කාර විඥාන නාමරූප ෂ
ඩායතන ස්පර්ශවේදනා තෘෂ්ණා උපාදාන භව ජාති
නැමැති දැවිඇති සංසාරචක්‍රයෙහි පරිභ්‍රමත් සියලු
සත්වයන් විසින් අනුභව කටයුතුවූ ජාතිජරාමරණාදිවූ
සංසාරව්‍යසනයම "දුඃඛසත්‍ය"නම් වේ.

"ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛසමුදයං අරියස
ච්චං යා යං තණ්හා පොනොබ්භවිකා නන්දිරාගසහගා

තා තත්‍ර තත්‍රාභිනන්දිනී, සෙය්‍යථීදං? කාමතණ්හා භවතණ්හා විභවතණ්හා" යනාදීන් දක්වනලද අචෙතනසචෙතනක වස්තුවිෂයෙහිවූ කාමතෘෂ්ණාදිවශයෙන් ත්‍රිවිධවූ අධ්‍යාත්මිකබාහ්‍ය අතීතානාගතවර්තමාන කාලසම්බන්ධ භෙදයෙන් අෂ්ටොත්තරශතප්‍රභෙදවූ තෘෂ්ණාවම "සමුදයසත්‍ය" නම් වේ.

"ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධං අරියසච්චං යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො" යනාදීන් දක්වනලද ශීලවිශුද්ධි චිත්තවිශුද්ධි දෘෂ්ටිවිශුද්ධි කාංක්ෂාවිතරණවිශුද්ධි මාර්ගාමාර්ගඥානදර්ශනවිශුද්ධි ප්‍රතිපදාඥානදර්ශනවිශුද්ධි ඥානදර්ශනවිශුද්ධි යන සප්තවිශුද්ධිපරම්පරාවෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුවූ ශ්‍රොතාපත්තිමාර්ගය ශ්‍රොතාපත්තිඵලය සකෘදාගාමිමාර්ගය සකෘදාගාමිඵලය අනාගාමිමාර්ගය අනාගාමිඵලය අර්හත්මාර්ගය අර්හත්ඵලය මේ අෂ්ටවිධ ලොකොත්තර ධර්මයන් කෙරෙහි නවවැනිවූ පර්‍යන්තවූ මාර පරාජයකොට ත්‍රිවිධ බොධිසමධිගමයකළ බුද්ධප්‍රත්‍යෙකබුද්ධබුද්ධශ්‍රාවකයන් විසින් සාක්ෂාත් කළාවූ ශාන්තාජරාමරාමෘතමහා නිර්වාණයම "නිරොධසත්‍ය" නම් වේ.

"ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනී පටිපදා අරියසච්චං අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං? සම්මාදිට්ඨි සම්මාසංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි" යනාදීන් දක්වනලද මධ්‍යමප්‍රතිපත්තිකාවූ අෂ්ටාඞ්ගිකමාර්ගයම "මාර්ගසත්‍ය" නම් වේ.

දුඃඛසත්‍යයෙහි දු ශබ්ද කුත්සිතාර්ථයෙහි වැටේ, ඛ ශබ්ද තුච්ඡාර්ථයෙහි වැටේ, පළමුවන සත්‍යය අනෙකොපද්‍රවාධිෂ්ඨාන වනබැවින් කුත්සිතයි, බාලජන පරිකල්පිතනිත්‍යසුඛශුභාත්මභාවරහිත වනබැවින්

තුච්ඡයි, මෙසේ කුත්සිතවනබැවින් තුච්ඡ වනබැවින් ද දුඃඛවේ, සමුදයසත්‍යයෙහි සං යන්නු සංයොගයෙහි වැටේ, උත් යන්නු උත්පත්තියෙහි වැටේ, අයශබ්දකාරණයෙහි වැටේ, මෙසේ දෙවන සත්‍යය ප්‍රත්‍යයසමායොගයෙක් ඇතිකල්හි දුඃඛොත්පත්තියට කාරණ වනබැවින් සමුදය වේ, නිරොධසත්‍යයෙහි නි ශබ්ද අභාවයෙහි වැටේ, රොධ ශබ්ද චාරකයෙහි වැටේ,(චාරක නම් දඟගෙයයි) මෙසේ තුන්වන සත්‍යය සර්වගතිශූන්‍ය වනබැවින් සංසාරචාරකසංඛ්‍යාත දුඃඛයාගේ අභාවයහෙයින් නිරොධ වේ, දුඃඛ නිරොධයට පමුණුවන ප්‍රතිපත්ති ආලම්බනවශයෙන් තදභිමුඛීභූත වනබැවින් මාර්ග වේ.

මෙහි භවසුඛාස්වාදග්‍රථිත සත්ත්වයන්ට සංවෙගඋපදවනු සඳහා පළමුකොට දුඃඛසත්‍යය දෙසිතයි, ඒ දුඃඛසත්‍යයට භවහෙතු දක්වනු සඳහා තදනන්තරකොට සමුදයසත්‍යය දෙසිනයි, ඊට ඉක්බිති හෙතුක දුඃඛයෙන් අභිභූත වනබැවින් කලකිරුණු සිත් ඇති ජනයන්ට නිස්සරණදර්ශනයෙන් ආස්වාද උපදවනු සඳහා නිරොධසත්‍යය දෙසිතයි. ඊට ඉක්බිති නිරොධාධිගම සඳහා නිරොධසම්ප්‍රාප්ති මාර්ගසත්‍යය දෙසිතයි, භාරයක් සෙයින් දුඃඛසත්‍යය දතයුතුයි, භාරාදානයක් සෙයින් සමුදයසත්‍යය දතයුතුයි, භාරනිඃක්ෂෙපණයක් සෙයින් නිරොධසත්‍යය දතයුතුයි, භාරනිඃක්ෂෙපණොපාය සෙයින් මාර්ගසත්‍යය දතයුතුයි, මේ යථොක්තවූ චතුස්සත්‍යයෙහි මේ දුඃඛය මේ සමුදය මේ නිරොධය මේ මාර්ගයයි උපදනා ඥානය 'සත්‍යඥාන'නම් වේ, මේ එක්පරිවෘත්තයෙකි, ආකාරවශයෙන් සතරෙස්වේ. දුඃඛය පරිඥෙයය, සමුදය ප්‍රහෙයය, නිරොධය සාක්ෂාත්කාතව්‍යයය, මාර්ගය වැඩියයුතුයයි උපදනා ඥාණය ''කෘත්‍යඥාන'' නම් වේ, මේ එක්පරිවෘත්තයෙකි, ආකාරවශයෙන් සත

රක් වේ. දුඃඛපරිඥානය සමුදයප්‍රහීණය නිරෝධ ය සාක්ෂාත්කරණය මාර්ගභාවනය යයි උපදනා ඥාණය "කෘතඥාන" නම් වේ, මේ එක්පරිවර්තයෙක්, ආකාරවශයෙන් සතරෙක් වේ. මේ චතුස්සත්‍යයෝ යථාක්‍රමයෙන් ප්‍රවෘත්ති ප්‍රවෘත්තිහෙතු නිවෘත්තිහෙතු විශයෙන් දක්නාලද බාධනප්‍රභවශාන්තිනිර්‍ය්‍යාණප්‍රකාර සර්වවිපරීතභාවයෙන් ආර්‍ය්‍යඥානයට ගොචර වන හෙයින් චතුරාර්‍ය්‍යසත්‍යයෝ නම් වේත්. බුදුහු මේ චතුරාර්‍ය්‍යසත්‍යයන් තමන්වහන්සේ ශ්‍රීමහාබෝධිද්‍රැම මූලයෙහිදී අවබෝධකළහෙයිනුත් පශ්චාත් භාගයෙහි විනෙයජනයන්ට අවබෝධ කළහෙයිනුත් "බුද්ධ" නම් වනසේක.

"භගවා" යන නම්හි

"භාග්‍යවා භග්ගවා යුත්තො භගෙහි ච විභත්තවා
භත්තවා වන්තගමනො භවෙසු භගවා තතො"

යනුහෙයින් බුදුහු ලෞකිකලෝකොත්තරගිතසුඛාභිනිර්වර්තක දානශීලාදි පාරමිතාසම්භාගයෙන් යුක්තබැවින් "භාග්‍යවන්තයන්"යන වාක්‍යයෙහි නෛරුක්තිකවිධියෙන් හා ශබ්දප්‍රවෘත්තියෙන් "භගවත්" නම් වනසේක, තවද බුදුහු ලොභදොෂමොහවිපරීත මනස්කාරාදී ක්ලේශසහස්‍රයන් හා සාංක්ලෙශපයෙන් ක්ලේශස්කන්ධාභිසංස්කාරමෘත්‍යුදේවපුත්‍රමාරයන් භග්නකළහෙයින් "භග්නවාහිනී භගවාන්" යන වාක්‍යයෙහි 'භඤ්ජාවමර්දනෙ' යන ධාතූන්ගෙන් කාද්‍යාදේශාධිකක්‍රමයෙනුත් "භගවත්" නම් වනසේක, තවද බුදුහු

"ඓශ්වර්‍ය්‍යස්‍ය සමග්‍රස්‍ය ධෛර්‍ය්‍යස්‍ය යශසඃ ශ්‍රියඃ
කාමස්‍යාර්ථ ප්‍රයත්නස්‍ය ෂණ්ණාං භග ඉති ශ්‍රුතිඃ"-යි

කියනලද ඓශ්වර්‍ය්‍ය පූර්ණයශඃශ්‍රීසංකල්පධර්මප්‍රයත්නය යන ෂට්ගුණයෙන් පරිපූර්ණ හෙයින් 'භගෙෂීද්‍යන්ත ඉති භගවාන්' යන වාක්‍යයෙහි යථොක්ත ත

ඩිතවයුත්පත්ති නයින්ද 'භගවත්' නම් වනසේකි. ත
වද බුදුහු කුශලාදිධර්මයන් පඤ්චස්කන්ධ ද්වාදශායතනා
ෂ්ටාදශධාතු චතුරාර්‍යසත්‍ය ද්වාවිංශතීන්ද්‍රිය ද්වාදශාඞ්ග ප්‍ර
තීත්‍යසමුත්පාද චතුස්මෘතිප්‍රස්ථාන සම්‍යක්ප්‍රධානා
දි වශයෙන් විභාගකළහෙයින් "විභත්තවානිති භග
වාන්"යන වාක්‍යයෙන් "භාජ පෘථක්කර්මණි"යන ධා
තුහුකෙරෙන් පූර්වෝක්ත කෘදන්තනාම වශයෙනුත්
'භගවත්' නම් වනසේකි, තවද බුදුහු දිව්‍යබ්‍රහ්මාර්‍යවි
හාරකායවිවේකචිත්තවිවේකශූන්‍යතාප්‍රණිහිතා නිමි
ත්තවිමොක්ෂපර්‍යායවූ ලෞකිකලෝකෝත්තර උ
ත්තරිමනුෂ්‍යධර්මයන් භජනය කළහෙයින් "භත්ත
වානිති භගවාන්"යන වාක්‍යයෙනි "භජ සේවායාම්"
යන ධාතුවෙන් කෘත්ප්‍රත්‍යයක්‍රමයෙනුත් 'භගවත්' නම්
වනසේකි. තවද බුදුහු කාමරූපාරූපසංඛ්‍යාතභවත්‍ර
යෙහි තෘෂ්ණාගමනය අහිද්මාගීඥානමුඛයෙන් වා
න්තකළහෙයින් 'භවෙසු වාන්තගමනොති භගවාන්'
යන සමාසවිධියෙන් ගා නෛරුක්තික නයිනුත්
"භගවත්" නම් වනසේකි, තවද

"භගවාති වචනං සෙට්ඨං භගවාති වචනමුත්තමං
ගරුගාරවයුත්තො සො භගවා තෙන වුච්චති"-යි

යනුහෙයින් බුදුහු අපරිමිතනිරූපම ප්‍රභාවයිද්‍රාද්‍ය
ශෙෂගුණවිශෙෂසමඞ්ගිත්වයෙනුත් "භගවත්" නම්
වනසේකි. තවද බුදුහු සර්වානර්ථපරිහාර පූර්වඞ්ගමවූ
නිරවශෙෂ හිතසුඛවිධානතත්පරනිරන්තරය ප්‍රයොග
සම්පත්තියෙන් දෙවිමිනිසුන් සහිතව සත්වලොකයා
හට අත්‍යන්තොපකාරකත්වයෙනුත් "භගවත්" නම්
වනසේකි. තවද බුදුහු ප්‍රමාණාතික්‍රාන්තලොකධාතු
ගතඅනන්තාපර්‍යන්තසත්වයන්ට උත්තමගොචරස්ථා
නීයවූ හෙයිනුත් "භගවත්" නම් වනසේකි, අනිකුදු

"භගගරුගොති භගවා, භගගාදෙසොති භගවා, භ
ගහමෙලොති භගවා, භගසම්පන්නොති භගවා, භා

ගාදීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගක්ලෙසොති භගවා, භජී විභජී පටිභජී ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා, භාවිතකායො භාවිතසීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා" යනාදීන් ප්‍රශංසාවන්ට අනුව දම්සෙනෙවිසැරියුත් මහතෙරුන්වහන්සේවිසින් වදාළ නිද්දෙශපාලිනිද්දිෂ්ටවාච්‍යභෙදයෙනුත් බුදුනු "භගවත්" නම් වනසේකි. තවද:-

"ගුණෛරතුල්‍යෛර්නිඛිලෛ සමාගමා
දශෙෂදොෂොපසමාච්ඡිනො ගුරුඃ
සමග්‍රමාහාත්ම්‍ය විභූසණො යතඃ
ප්‍රකීත්තිතො'ස්මාද භගවානසාවිති"

කියනලද සමග්‍රගුණ මාහාත්ම්‍යයෙන් විභූෂිතහෙයිනුත් "භගවත්" නම් වනසේකි.

'භග්ගරාගො භග්ගදොසො භග්ගමොහො අනාසවො
භග්ගාස්ස පාපකා ධම්මා භගවා තෙන පවුච්චති'

භග්ගරාගො, යම්හෙයකින් මේ තථාගතයෝම භග්නවූ රාගඇත්තෝද, භග්ගදොසො, භග්නවූ ද්වේෂඇත්තෝද, භග්ගමොහො, භග්නවූ මොහඇත්තෝද. අනාසවො, ක්ෂීණවූ චතුරාශ්‍රවයන් ඇතිහෙයින් අනාශ්‍රවද; අස්ස, මේ තථාගතයාණන්විසින්; පාපකා ධම්මා, සියලු අකුශලධර්මයෝ; භග්ගා, යම්හෙයකින් නසනලදහුද; තෙන එහෙයින්, භගවාති පවුච්චති "භගවා"යයි කියනුලැබේ.

"භගවාති වචනං සෙට්ඨං භගවාති පදමුත්තමං
ගරුගාරවයුත්තො සො භගවා තෙන පවුච්චති"

යෙන, යම්හෙයකින්; භගවාති වචනං, භගවා යන මේ වචනයතෙම, සෙට්ඨං; ශ්‍රේෂ්ඨගුණසහචාරත්වයෙන්ද ශ්‍රේෂ්ඨවාචකවූ වචනයෙන්ද නොහොත් ශ්‍රේෂ්ඨයා භගවනහෙයින් ශ්‍රේෂ්ඨද, භගවාති වචනං, යන මේ වචනයතෙම; උත්තමං, උත්තමගුණ සහචාර

ඨයෙන් උත්තමය කියන්නාවූ වචනයෙන්ද නොහොත් උත්තමයා භගවනාමයෙහින් උත්තමද; සො, ඒ භාග්‍යවත්තෙම ; යෙන, යම්හෙයකින් ; ගරු, තුන්ලෝවාසීන්ට ගුරුද ; ගාරවයුත්තො, යම්හෙයකින් ගරුගුණයෙන් යුක්තද හෙවත් ගෞරවාර්හද; තෙන, එහෙයින්, භගවා පවුච්චති "භගවා"යි කියනුලැබේ නොහොත් ගාරවයුත්තො ; ශීලාදිගරුගුණයෙන් යුක්තවූ; සො ගරු, ඒ ත්‍රිලොගුරුසම්‍යක්සම්බුද්ධතෙම ; භගවා පවුච්චති "භගවා" යි කියනුලැබේ.

"භාග්‍යවා භග්ගවා යුත්තො භගෙහි ච විභත්තවා
භත්තවා වන්තගමනො භවෙසු භගවා තතො"

[යතො, යම්හෙයකින්] භාග්‍යවා. ලොවී ලොවුතුරු සුව නිපදවන්නාවූ දානසීලාදී කෙළ පැමිනි භාග්‍ය ඇත්තේද; භග්ගවා, රාගද්වෙෂාදී සකල කෙලශශත්‍රූන් අභිද්‍ය මාර්‍ගඥානශස්ත්‍රයෙන් පැහැර භග්නකෙළේද; භගෙහි ච ඓශ්වර්‍ය්‍යාදී ෂඩ්විධ භගධර්ම්මයෙන්හා දෙතිස්වරලක්‍ෂණයා අසූඅනුව්‍යඤ්ජනයෙන් ; යුත්තො ච, යුක්තද ; විභත්තවා, කුශලාදීන් ස්කන්ධාදිවශයෙන්ද ස්කන්ධාදීන් කුශලාදිවශයෙන්ද විභාගකොට දෙසීද ; නොහොත් සතිපට්ඨාන සම්මප්පධාන ඉද්ධිපාද ඉන්ද්‍රියබල බොජ්ඣඞ්ග මග්ගඞ්ග ආයතන ධාතු සච්ච පටිච්චසමුප්පාදාදී ධර්ම්මයන් දිව්‍යමනුෂ්‍යයන්ට නානාප්‍රකාරයෙන් විභාග කොට දැක්වීද ; භත්තවා, දිව්‍යබ්‍රහ්මාර්‍ය්‍යවිහාරාදීන් භජනය සෙවනය කෙළේද ; නොහොත් අර්ථරසාදීන්ට භාගීද-භිම්ද ; නොහොත් නාගුරුළදෙව්බඹමිනිස් ඈ බොහෝ භක්තයන් ඇත්තේ ; භවෙසු, තුන්භවයෙහි; වන්තගමනො, ආර්‍ය්‍යමාර්‍ගඥානමුඛයෙන් වමනය කරණලද තෘෂ්ණාසංඛ්‍යාත ගමන් ඇත්තේද ; තතො, එහෙයින් ; භගවා ; "භගවා"නම් වේ.

"භග්ගි භජි භාගි විභත්තවා ඉති
අක්කාසි භග්ගන්ති ගරූති භාග්‍යවා
බහූහි ඤායෙහි සුභාවිතත්තනො
භවන්තගො සො භගවාති වුච්චති"

භගී ඉති, ඓශ්වර්‍ය්‍යාදී ෂඩ්විධ භගධර්‍මයන් ඇත්තේනුයි කියාද; භජි ඉති, මාර්ගඵලනිර්වාණසංඛ්‍යාත වූ ආර්‍ය්‍යධර්‍මරත්නයද ගැඹුරු වල්ගිවු දුරුසෙනසුන්ද සෙවිනුයි කියාද ; භාගී ඉති, චීවර පිණ්ඩපාතාදී චතුර්විධ ප්‍රත්‍යයටද අර්ථරස ධර්‍මරස විමුක්තිරසයටද අධිසීල අධිචිත්ත අධිප්‍රඥාවටද භාගීනුයි කියාද ; විභත්තවා ඉති, ලෞකිකලෝකොත්තරධර්‍මයන් සකන්ධායතනධාත්වාදී විශයෙන් විභාගකෙළේනුයි කියාද ; භග්ගං අකාසි ඉති, රාගාදී සියලු පාපධර්‍මයන් බොධිමණ්ඩලයෙහිදී වාසනාසහා සමග භග්න කෙළේනුයි ; හෙවත් නැසීනුයි කියාද; ගරු ඉති, සනරාමරලොකයාවිසින් පාෂාණච්ඡත්‍රයක් මෙන් ගරුකටයුතුබැවින් ගරුනුයි කියාද ; භාග්‍යවා ඉති, දානසීලාදි පාරමිතාසාගරයෙහි පාරප්‍රාප්තබැවින් කොටිප්‍රාප්තවූ භාග්‍ය ඇත්තේනුයි කියාද, බහූහි ඤායෙහි ; කායභාවනාදී බොහෝ භාවනා ක්‍රමයෙන් සුභාවිතත්තනො; මනාකොට වඩනාලද සිත්ඇති බැවින් ; භවන්තගො සියලු සත්වයන්ගේ කෙළවරයයි කියනලද නිර්වාණයට ගියාවූ, සො, ඒ ගුරුතෙම; භගවාති 'භගවා'යි කියනුලැබේ.

නවඅරගාදි-

බුදුගුණසන්නය


නිමි.

# ශුද්ධිපත්‍රය.

| පිට | පේලි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 2 | 8 | අරිංණ | අරිණං |
| 3 | 25 | මධ්‍යසතාත්‍රු | මධ්‍යසථාත්‍රු |
| 6 | 21 | පෙසී | පෙශී |
| ,, | 24 | සිව් | සිවු |
| 7 | 15 | ශායනා | හායනා |
| ,, | 20 | සතාධ්‍යක්ෂ | ශතාධ්‍යක්ෂ |
| 9 | 7 | සත | ශත |
| 11 | 23, 27 | සානා | ස ණ |
| ,, | 26 | සපෂී | සපශී |
| 12 | 2 | පෙඨ්ඨබ | පොට්ඨබ්බ |
| ,, | 3 | ෂට්විධ | ෂඩ්විධ |
| ,, | 12 | කුම්භිල | කුම්භීර |
| 14 | 31 | යනුහෙයින් ම කියනලදී | යනුඑහෙයින් ම කියනලදී* |
| 20 | 7 | සීඝ්‍රසීඝ්‍ර | ශීඝ්‍රශීඝ්‍ර |
| ,, | 17 | ශූන | ශූණ |
| ,, | 14 | සාසිවීස | සාශිවීෂ |
| 26 | 4 | සම්පයොගො | සම්පයොගා |
| 27 | 7 | සුබුම්වජ්ච් | සුබුම්වජ්චි |
| 28 | 12 | ජිනෙ | ජිනො |
| 34 | 28-30-31 | රසාග්‍රාසාග්‍ර | රසග්‍රාසාග්‍ර |
| 37 | 31 | පුගම්යෝ | පුගාමයෝ |
| 46 | 10 | සලක්ෂශයෙනුත් | සලක්ෂණ යෙනුත් |

* මෙබඳුතැන් මෙසේම සැලකියයුතු

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු